**<u>කොළඹ ත්‍රිපුද්ගල මහාධිකරණය ඉදිරිපිටදීය.</u>**

**<u>කොළඹ මහාධිකරණ විනිසුරු ගරු ආදිත්‍ය පටබැඳිගේ මැතිතුමා. (සභාපති)</u>**

**<u>කොළඹ මහාධිකරණ විනිසුරු ගරු මංජුල තිලකරත්න මැතිතුමා.</u>**

**<u>කොළඹ මහාධිකරණ විනිසුරු ගරුඑම්.ඩබ්.ජේ.කේ.වීරමන් මැතිතුමා.</u>**

<u>නඩු අංකය : HC(TAB)751/2019</u>  <u>දිනය : 2021.05.21</u>

(සටහන් ගැනීම : ල/ලේ.තියුනි හිමල්කා මෙය, ල/ලේ. ඉරේෂා ප්‍රියදර්ශනී මෙය සහ ල/ලේ. මධුෂානි කරුණාරත්න මිය විසිනි.)

## <u>තී න් දු ව</u>

අප විසින් 2020.01.17 දින ප්‍රකාශ කරන ලද නියෝගය මගින් එක් එක් චූදිතට එරෙහිව පහත සඳහන් අධිචෝදනා පමණක් පවත්වා ගෙන යා හැකි බව තීරණය කළෙමු.

1. 5 වන චූදිතට එරෙහිව නගා ඇති 7552, 7563 සහ 7572 දරන චෝදනා.
2. 6 වනචූදිතට එරෙහිව නගා ඇති 7553 සහ 7564 දරන චෝදනා.
3. 7 වන චූදිතට එරෙහිව නගා ඇති 7554, 7565 සහ 7573 දරන චෝදනා.
4. 8 වන චූදිතට එරෙහිව නගා ඇති 7555 සහ 7566 දරන චෝදනා.
5. 9 වන චූදිතට එරෙහිව නගා ඇති 7556 සහ 7567 දරන චෝදනා.
6. 10 වන චූදිතට එරෙහිව නගා ඇති 7549 සහ 7560 දරන චෝදනා.
7. 11 වනචූදිතට එරෙහිව නගා ඇති 7557, 7568 සහ 7571 දරන චෝදනා.
8. 13 වන චූදිතට එරෙහිව නගා ඇති 7558 සහ 7569 දරන චෝදනා.

ඉහත සඳහන් අධිචෝදනා අධිකරණයේ පෙනී සිටි සියළුම චූදිතයන්ට කියවා තේරුම් කර දුන් අතර ඔවුන් එකී අධිචෝදනාවලට වෙන් වෙන් වශයෙන් නිවැරදිකරුවන් බවට පවසා සිටින ලදී. විශේෂයෙන්ම 10 වන චූදිත යුක්රේනියානු ජාතිකයෙකු වන අතර ඔහුගේ ඉල්ලීම මත යුක්රේනියානු භාෂාවට පරිවර්ථනය කරන ලද අධිචෝදනා පත්‍රයේ පිටපතක් ඔහුට ලබා දුන් අතර නඩු

විභාගයේදී රුසියානු භාෂා පරිවර්තකයෙකුගේ සහාය ඔහු ඉල්ලා සිටි අතර සමස්ථ නඩු විභාගයම රුසියානු භාෂා පරිවර්තකයෙකුගේ සහාය ලබාගනිමින් පවත්වන ලදී.

මෙම නඩුවේ පැමිණිල්ල වෙනුවෙන් නිලන්ත හීනැටිගල, විදාන ගමගේ ප්‍රදීප් වීරසිංහ, මනෝහර බණ්ඩාර වැත්තැව, රවීන්ද්‍ර චන්ද්‍රසිරි විජේගුණවර්ධන, කරුණාසේන හෙට්ටිආරච්චි, කළණමිත්‍ර ජිනදාස, චන්ද්‍රකාන්ති ජයසිංහ, ප්‍රියංගනී බස්නායක, ඉනෝකා ප්‍රියදර්ශනී, අලුත්ගේ සෙනරත්, මධුෂානි වීරසේකර යන සාක්ෂිකරුවන් සාක්ෂි දී ඇත. පැමිණිල්ල අවසන් කිරීමෙන් පසු ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල විසින් විත්තිවාචක කැඳවීමට තීරණය කරන ලදුව චූදිතයන්ගේ අයිතිවාසිකම් පහදා දෙන ලදී. ඒ අනුව 6, 7, 8, 9, 10, 11, 13 චූදිතයන් විත්තිකූඩුවේ සිට ප්‍රකාශ කරන ලදී. 5 වන චූදිත නඩු විභාගය අතරතුරදී මියගියේය.

මෙම නඩුවේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සම්පිණ්ඩනය කිරීමට ප්‍රථමයෙන් මෙම නඩුව සම්බන්ධයෙන් විනිශ්වයකට එළැඹීමේදී අනුගමනය කළ යුතු සහ සළකා බැලිය යුතු නීතිමය සිද්ධාන්ත කිහිපයක් සඳහන් කර සිටිමු.

ඉදිරිපත් කරන ලද තොරතුරු වාර්තාවේ සඳහන් අධිචෝදනා සාධාරණ සැකයෙන් තොරව ඔප්පු කිරීමේ භාරය පැමිණිල්ල සතුවේ. එහිදී විත්තියට කිසිදු ඔප්පු කිරීමේ භාරයක් නොපැවරෙන අතර පැමිණිල්ලේ සාක්ෂි සම්බන්ධයෙන් සාධාරණ සැකයක් ජනිත කිරීම පමණක් ප්‍රමාණවත් වේ. එසේම විත්ති වාචකයේ සඳහන් දූර්වලතා නොසළකා ඉදිරිපත් කර ඇති අධිචෝදනා ඔප්පු කිරීමේ භාරය සහමුලින්ම පැමිණිල්ල මත රඳා පවතී. එසේම නඩු විභාගයේදී චූදිතයින්ට නිහඬව සිටීමේ අයිතියක්ද ඇති අතර පැමිණිල්ල සාධාරණ සැකයෙන් තොරව අදාළ චෝදනා ඔප්පු කරනතෙක් චූදිතයින් සතුව නිර්දෝෂී භාවයේ පූර්ව නිගමනයේ රැකවරණය හිමිවේ.

ඉහත සඳහන් මූලික සිද්ධාන්තයන් කෙරෙහි අවධානය යොමු කරමින් ඉදිරිපත් කරන ලද සාක්ෂිවල සම්පින්ඩනයක් මුලින්ම ඉදිරිපත් කරමු.

## පැමිණිල්ලේ සාක්ෂි අංක 1

පැමිණිල්ල වෙනුවෙන් මුලින්ම සාක්ෂි දුන් රියර් අද්මිරාල් නිලන්ත හීනැටිගල මෙම සිද්ධියට අදාළ කාල සීමාව වන විට නාවික හමුදාවේ දක්ෂිණ කඳවුරට අදාළව නියෝජ්‍ය ආඥාපති වශයෙන් කටයුතු කර ඇති අතර 2015.10.05 වන දින ඔහු ආඥාපතිවරයා නිවාඩු ගොස් සිටි හෙයින්, එකී රාජකාරිය ආවරණය කර ඇත. එදින හවස්වරුව වන විට යම්කිසි හඳුනා නොගත් නෞකාවක් ශ්‍රී ලංකාවේ මුහුදු තීරයට ආසන්නව තිබෙන බවට තොරතුරු ලැබී ඇති අතර නාවික හමුදාව විසින් භාවිතා කරනු ලබන Channel 16 නමැති සංඥා ක්‍රමය යටතේ එකී නෞකාව හඳුනාගැනීමට උත්සාහ කර ඇත. මුල් අවස්ථාවේදී එය අසාර්ථක වුවද AIS යන්ත්‍රයට ලැබුණු තොරතුරු අනුව එම නෞකාව MV ඇවන්ට් ගාර්ඩ් වශයෙන්ද, එකී නෞකාව අවසානයට යාත්‍රා කළ වරාය සූඩානය වශයෙන්ද, මීළඟ වරාය කොළඹ වශයෙන්ද සටහන් වුණු බවට පවසන ලදී. එම නැව සමග තොරතුරු හුවමාරු කර ගැනීමට උත්සාහ කළද, එය අසාර්ථක වුවද එදින සවස පැය 17.40 ට පමණ නාවික හමුදාවේ යාත්‍රාවන් මගින් එම නෞකාව හඳුනාගැනීමට උත්සාහ කර ඇති අතර රාත්‍රී 8.00 ට, 9.00 ට පමණ MV ඇවන්ට් ගාර්ඩ් නෞකාව බවට හඳුනාගෙන ඇත. මෙම සාක්ෂිකරු වැඩිදුරටත් නාවික හමුදා මූලස්ථානයට මේ පිළිබඳව දැනුම් දී ඇති අතර නාවික හමුදා මූලස්ථානයෙන් මෙම නැව පිළිබඳව ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සර්විසස් සමාගම සමග සාකච්ඡා කිරීමේදී මෙම නෞකාව 2015.10.05 වන දින ඕෆ් චාර්ටර් කිරීම, එනම් එකී නැව සේවාවෙන් ඉවත් කිරීමට සූදානම් කර ඇති බවත්, එම නැව තුළ අවි ආයුධ කිසිවක් නොමැති බවටත් දැනුම් දුන් බව පවසන ලදී. ඒ අනුව සාක්ෂිකරු මෙම නැව ගාලු වරායට පැමිණීම සම්බන්ධයෙන් ඇති වූ සැකය මත දක්ෂිණ නාවික කඳවුරේ කුඩා යාත්‍රාවන් දෙකක් වීරසිංහ නමැති නිලධාරියාගේ නායකත්වයෙන් මෙම ඇවන්ට් ගාර්ඩ් නැව ස්ථානගත කර තිබූ ස්ථානයට යොමු කර ඇත. ඒ අනුව ලුතිනන් වීරසිංහ ඇතුළු නිලධාරීන් පිරිස 2015.10.06 දින පෙ.ව.8.20 ට ඇවන්ට් ගාර්ඩ් නෞකාවට ගොඩ වී ඇත. ඉන්පසු ඔහු දැනුම් දී ඇත්තේ ඇවන්ට් ගාර්ඩ් නෞකාව තුළ විශාල වශයෙන් අවි ආයුධ සහ උණ්ඩ පවතින බවත්, නැවේ කපිතාන්වරයා විදේශිකයෙකු බවත්ය.

ලුතිනන් වීරසිංහ වැඩිදුරටත් දැනුම් දී ඇත්තේ ඇවන්ට් ගාර්ඩ් නෞකාව තුළ තිබූ ගිනිඅවි සහ උණ්ඩ අතරින් ගිනිඅවි තුනක් සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයෙන් ලබාදුන් ලිපියක් ඔවුන් සතුව තිබූ බවත්, සෙසු ගිනිඅවි සහ උණ්ඩ සම්බන්ධයෙන් කිසිදු අවසර පත්‍රයක් නොතිබුණු බවත්ය. මේ සම්බන්ධයෙන් සාක්ෂිකරු විසින් නාවික හමුදාපතිවරයාට දුරකථනයෙන් දැනුම් දී ඇති අතර නාවික හමුදාපතිවරයා නැව අත්අඩංගුවට ගැනීමට නියම කර ඇත. එසේ අත්අඩංගුවට ගත් ඇවන්ට් ගාර්ඩ් නෞකාව ඔක්තෝබර් 13 වන දින ගාලුවරායට රැගෙනැවිත් ඇත. කෙසේ වෙතත් 2016.10.05 වන දින දිවා කාලයේ නාවික හමුදා මූලස්ථානයෙන් මෙම නෞකාවට ගිනිඅවි රැගෙන යාම සම්බන්ධයෙන් අනුමැතිය දී ලිපියක් ලබාදී ඇති බවට සාක්ෂිකරුට දැනුම් දී ඇත. නඩු විභාගයේදී **පැ.6** ලෙස එම ලිපිය ලකුණු කළ අතර ඒ සම්බන්ධයෙන් පසුව වැඩිදුරටත් සාකච්ඡාවට ලක්කරමු.

සමස්ථයක් ලෙස මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙහි හරය වන්නේ 2015.10.06 වන දින නාවික හමුදාව විසින් ඇවන්ට් ගාර්ඩ් නෞකාව තම භාරයට ගන්නා අවස්ථාවේදී ගිනිඅවි තුනකට හැර සෙසු ගිනිඅවි සහ උණ්ඩ සම්බන්ධයෙන් කිසිදු බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නොතිබුණු බවයි. එම හේතුව මත නාවික හමුදාපතිවරයාගේ උපදෙස් මත ක්‍රියා කරමින් මෙම නෞකාව අත්අඩංගුවට ගැනීමට හේතු වුණ බව පවසයි.

<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 2</u>

ලුතිනන් කමාන්ඩර් ප්‍රදීප් වීරසිංහ 2015.10.05 දින වන විට නාවික හමුදා දක්ෂිණ කඳවුරේ ලුතිනන්වරයෙකු ලෙස කටයුතු කර ඇති අතර කොමදෝරු ජයසිංහ නිලධාරියාගේ අවසරය මත මෙම සැක සහිත නෞකාව පරීක්ෂා කිරීම සඳහා ගොස් ඇවන්ට් ගාර්ඩ් නෞකාව සමග තොරතුරු හුවමාරු කරමින් කටයුතු කර, 2015.10.06 වන දින ඇවන්ට් ගාර්ඩ් නෞකාවට ගොඩ වී ඇත. එම නැව පරීක්ෂා කිරීමේදී ඒ තුළ කන්ටේනර් පෙට්ටියක් තුළ ගිනිඅවි තිබූ බවත්, එය භාරව 6 වන චූදිත වන ඇල්බට් තිලකරත්න සහ 9 වන චූදිත වශයෙන් නම් කර ඇති නිලුපුල් ද කොස්තා නැවේ ප්‍රධානියා වශයෙන් කටයුතු කර ඇති අතර ඔවුන් මෙම ක්‍රියාන්විතයට සහාය ලබාදුන් බවත් පවසන ලදී.

**<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 19</u>**

මනෝහර බණ්ඩාර වැත්තැව නමැති සාක්ෂිකරු 2015.10.05 දින වන විට නාවික හමුදාවේ අධ්‍යක්ෂක ජනරාල් (මෙහෙයුම්) තනතුරේ රාජකාරි කර ඇත. මෙම නෞකාව පිළිබඳව තමා දැනගත් අවස්ථාවේ නැවේ අනන්‍යතාවය තහවුරු කර ගැනීම සම්බන්ධයෙන් සහ නැව පරීක්ෂා කිරීම සම්බන්ධයෙන් තමා නාවික හමුදා මූලස්ථානයේ සහ ගාලු වරායේ විවිධ නිලධාරීන් සමග සම්බන්ධ වෙමින් ක්‍රියා කළ බව පවසන ලදී. මෙම සාක්ෂිකරු මීට ඉහත සඳහන් කරන ලද **පැ.6** දරන ලිපිය සම්බන්ධයෙන් සාක්ෂි දී ඇති අතර ඔහුගේ ස්ථාවරය වූයේ ඒ පිළිබඳව තමා දැනගත්තේ නාවික හමුදාපතිවරයාගෙන් බවයි. මෙම සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් පවසා ඇත්තේ ඇවන්ට් ගාර්ඩ් නෞකාවේ අනන්‍යතාවය පිළිබඳව තමා පෙර සිට දැන සිටි බවත්ය.

**<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 20</u>**

මෙම සාක්ෂිකරු හිටපු නාවික හමුදාපති රවීන්ද්‍ර විජේගුණවර්ධන මහතා වේ. ඔහු සාක්ෂි දෙමින් 2015 ඔක්තෝම්බර් මාසය වන විට තමා ශ්‍රී ලංකා නාවික හමුදාවේ හමුදාපති වශයෙන් කටයුතු කරමින් සිටින විට මෙම නඩුවට අදාළ සිද්ධිය සම්බන්ධයෙන් ගාලු වරායේ නියෝජ්‍ය හාබර් මාස්ටර්වරයාගෙන් (Harbour Master) තොරතුරු ලැබී ඇති අතර ඒ අනුව ඔහු වීරසිංහ නමැති නිලධාරියාට එකී නැවට ගොඩ වීම සඳහා නියෝග කර ඇත. ඒ අනුව වීරසිංහ නමැති නිලධාරියා (පැ.සා. 2) නැවේ අවි ආයුධ තිබෙන බවට සාක්ෂිකරුට දැනුම් දී ඇත. පසුව මෙම අවි ආයුධ ගණන් කරඇති අතර එම ආයුධ සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයෙන් නිකුත් කරන ලද බලපත්‍රයක් හෝ අවසර පත්‍රයක් නොතිබුණු බවට දැනුම් දුන් හෙයින් එකී නැව අත්අඩංගුවට ගැනීමට නියෝග කර ඒ සම්බන්ධයෙන් ආරක්ෂක ලේකම්වරයාට දැනුම් දී ඒ පිළිබඳව වාර්තාවක්ද ආරක්ෂක ලේකම්වරයා වශයෙන් සිටි කරුණාසේන හෙට්ටිආරච්චි මහතාට භාරදුන් බව පවසන ලදී. ඒ වන විට ආරක්ෂක ලේකම්වරයා වශයෙන් සිටියේ කරුණාසේන හෙට්ටිආරච්චි (පැමිණිල්ලේ සාක්ෂි අංක 35) මහතා බවත්, ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා වශයෙන් 11 වන චූදිත සමන් දිසානායක මහතා කටයුතු කළ බව පවසන ලදී. සාක්ෂිකරු,

ආරක්ෂක ලේකම්වරයා හමු වීමට ගිය අවස්ථාවේදී ලිපියක් ලබාදුන් බවත්, එමගින් අදාළ අවි ආයුධ රතු මුහුදේ සිට ගාලු වරායට ගෙන යාම සඳහා අවසර දී ඇති බව දැනුම් දුන් බව පවසන ලදී. එකී ලිපිය **5 වී.18** හෙවත් **පැ.6** වශයෙන් ලකුණු කර ඇති ලේඛනය බවට සාක්ෂිකරු හඳුනා ගන්නා ලදී. එසේම අදාළ නෞකාවේ තිබූ අවි ආයුධවලින් ඇතැම් ඒවා රක්නා ලංකා සමාගමට අයත් බව සහ ඉන් ඇතැම් ආයුධවල අංක වෙනස් කර වෙනත් නොම්බරයක් ගසා තිබූ බවට සාක්ෂිකරුට දැනුම් දුන් හෙයින් ඒ අනුව ඇති වූ සැක කටයුතු තත්ත්වය මත අදාළ නැව අත්අඩංගුවට ගෙන පොලීසියට භාරකරන ලෙසට තම නිලධාරීන්ට උපදෙස් දුන් බව සාක්ෂිකරු පවසන ලදී.

**<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 35</u>**

මෙම සාක්ෂිකරු 2015.10.05 දින වනවිට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළ කරුණාසේන හෙට්ටිආරච්චි මහතා වේ. මෙම නඩුවට අදාළ නෞකාව ලංකාවට පැමිණීම සම්බන්ධයෙන් 11 වන චූදිත සමන් දිසානායක යන අය විසින් සාක්ෂිකරු දැනුවත් කළ හෙයින් එම නැව රතු මුහුදේ සිට ශ්‍රී ලංකාවට ඇතුළු වීමට පැමිණ ඒ සඳහා අවසර ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබූ නිසා ඒ පිළිබඳව ලිඛිතව නාවික හමුදාපතිවරයාගෙන් විමසා ඇත. නාවික හමුදාපතිවරයා සාක්ෂිකරුට රැස්වීමකදී හමු වී ඇති අතර එහිදී එකී නැව අත්අඩංගුවට ගෙන තිබෙන බව සාක්ෂිකරුට දැනුම් දී ඇත. ඒ අනුව නාවික හමුදාවේ අධීක්ෂණය යටතේ හා රේගු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ ගොඩබැසීමට අවසර දී නීත්‍යානුකූල නොවන කටයුත්තක් සිදු වී ඇත්නම් ඒ සඳහා නාවික හමුදාවේ නිරීක්ෂණය ලබාගෙන ඉදිරි කටයුතු කිරීම සුදුසු වේ යනුවෙන් තමා නිර්දේශ කර, එම නෞකාව සඳහා අනුමැතිය දී තිබෙන බව සාක්ෂිකරු විසින් නාවික හමුදාපති රවීන්ද්‍ර විජේගුණවර්ධන මහතාට දැනුම් දුන් බව පවසන ලදී.

**<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 18</u>**

අමරාබඳුගේ කළණමිත්‍ර ජිනදාස නමැති එම සාක්ෂිකරු සාක්ෂි දෙමින් තමා කොමදෝරු අධ්‍යක්ෂක නාවික මෙහෙයුම් වශයෙන් ඒ වනවිට කටයුතු

කළ බව පවසන ලදී. මෙම නඩුවට අදාළ සිද්ධිය වනවිට තමාට නියෝජ්‍ය ආඥාපති දකුණ, එනම් රියර් අද්මිරාල් හීනැටිගල විසින් යම්කිසි නැවක් සම්බන්ධයෙන් කිසිදු සන්නිවේදනයක් කර, සම්බන්ධ කර ගැනීමට නොහැකි වූ බවට දැනුම් දී ඇත. ඒ පිළිබඳව සොයා බැලීමේදී මෙම නැව ඇවන්ට් ගාර්ඩ් සමාගමට අයත් නැවක් බවට අනාවරණය වූ හෙයින් සාක්ෂිකරු ඒ පිළිබඳව එකී නැවේ සිටි කොමදෝරු දියබලනගේට දැනුම් දී ඇත. සාක්ෂිකරු විසින් මේ සම්බන්ධයෙන් අද්මිරාල් වැත්තැවට දැනුම් දී ඇති අතර නාවික හමුදාපතිවරයා විසින් එකී නැව නාවික හමුදාව භාරයට ගන්නා ලෙසට දැනුම් දී ඇති අතර සාක්ෂිකරු ඒ පිළිබඳව 8 වන වූදිත දියබලනගේට දැනුම් දුන් බව පවසන ලදී.

**<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 30</u>**

ජයසිංහ ආරච්චිගේ චන්ද්‍රකාන්ති ජයසිංහ නමැත්තිය වර්ෂ 2015 වන විට ආරක්ෂක අමාත්‍යාංශයට අනුයුක්තව රාජ්‍ය කළමනාකරණ සහකාරවරියක වශයෙන් කටයුතු කර ඇත. මෙම නඩුවට අදාළ සිද්ධිය වන විට ඇය රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරියක වූ දමයන්ති ජයරත්න මහත්මියගේ පුද්ගලික සහකාර වශයෙන් කටයුතු කර ඇත. ඇයට පැවරී තිබුණු රාජකාරිය වනුයේ දමයන්ති ජයරත්න මහත්මියගේ විද්‍යුත් තැපැල පරීක්ෂා කර බලා ඒ පිළිබඳව අතිරේක ලේකම්වරියට දැනුම් දීමෙන් අනතුරුව අදාළ විෂය භාර නිලධාරීන්ට ඒවා බෙදාහැරිම වේ. දමයන්ති ජයරත්න මහත්මිය ඒ වන විට අමාත්‍යාංශයේ පුපුරණ ද්‍රව්‍ය සහ තුවක්කු සම්බන්ධයෙන් පාලනය භාරව සිට ඇති අතර සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ ලියකියවිලි සම්බන්ධයෙන්ද කටයුතු කර ඇත. පසුව එම තනතුරෙන් ඇය ඉවත් වී ඇති අතර එම තනතුර සඳහා 11 වන වූදිත සමන් දිසානායක මහතා පත් වී ඇත. ඒ අනුව සාක්ෂිකාරිය අදාළ ආයතනයේ Receiving Internal and External Letters and Documents යන ලේඛනය භාරව සිට ඇති අතර මෙම නඩුවට අදාළ කාලය වන විට එම ලේඛනයේ තමාගේ අත්අකුරු ඇති බවත්, අදාළ පොත වන **පැ.8** හි ඇවන්ට් ගාර්ඩ් සමාගමේ සභාපතිවරයාගෙන් හෝ රක්නා ලංකා සමාගම වෙතින් කිසියම් ලිපියක් ලැබුණු බවට 2015.09.28 දින වන විට සටහනක් නොමැති බව පවසන ලදී.

**<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 31</u>**

බස්නායක මුදියන්සේලාගේ ප්‍රියංගනී බස්නායක නමැති සාක්ෂිකාරිය 2015 ඔක්තෝබර් මාසය වනවිට සිවිල් ආරක්ෂක අමාත්‍යාංශයේ ලිපිකරුවෙකු වශයෙන් කටයුතු කර ඇත. ඇය වෙත රක්නා ලංකා සමාගමේ විෂය පැවරී තිබී ඇත. **පැ.6** වශයෙන් සලකුණු කර ඇති ලිපිය තමා සකස් කරන ලද ලිපියක් නොවන නමුත් **පැ.3** ලිපිය තමා සකස් කරන ලද්දක් බව පවසන ලදී. එසේම **පැ.6** වශයෙන් සලකුණු කර ඇති ලිපියේ සැප්තැම්බර් යන්න කපා ඔක්තෝබර් යනුවෙන් ලිවීම සාක්ෂිකරු විසින් නොකළ බවද, එම ලිපිය යතුරු ලියනය කිරීමක් හෝ තමා නොකළ බව පවසන ලදී. අදාළ ආයතනයේ අවසර පත්‍රය සකසන විට රක්නා ලංකා ආයතනයෙන් සොෆ්ට් කොපි එකක් පෙන්ඩ්‍රයිව් එකක දාගෙන ඇවිත් ආරක්ෂක අමාත්‍යාංශයේ ලෙටර් හෙඩ් එකකට දාගෙන ඒම සාමාන්‍යයෙන් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ගය බව පවසන ලදී.

**<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 29</u>**

ඉනෝකා ප්‍රියදර්ශනී සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සිවිල් අංශයේ රාජකාරි කර ඇති අතර 2015 සැප්තැම්බර් මාසය වනවිට පරිගණක ක්‍රියාකාරිනියක් වශයෙන් කටයුතු කර ඇත. ඇය වාණිජ නැව්වල හෝ දක්ෂිණ අවි ගබඩාවේ තැන්පත් කර ඇති අවි සම්බන්ධයෙන් අතිරේක ලේකම්වරිය අනුමැතිය දුන් පසු ඊට අදාළ ලිපි පිළියෙල කිරීම ඇයගේ රාජකාරිය වී ඇත. එසේම රක්නා ලංකා සමාගමේ සීමාෂල්වරුන් ඉදිරිපත් කරන ලිපි යතුරු ලියනය කිරීමද ඇය විසින් සිදු කර ඇත. ඇය පවසන්නේ මෙවැනි අනුමැතිය සඳහා ඉදිරිපත් කරනු ලබන ලිපි රක්නා ලංකා ආරක්ෂක සමාගමෙන් පෙන්ඩ්‍රයිව්වල ඇතුළත් කරගෙන එන බවත්, අනුමැතිය ලැබීමෙන් පසු ලබාදෙන ලිපියද ඔවුන් විසින් පෙන්ඩ්‍රයිව් එකක ඇතුළත් කරගෙන එන බවත්, ඒවා ලිපි ශීර්ෂවලට යොදා මුද්‍රණය කර අත්සන් කර අදාළ නිලධාරියාට යොමු කිරීම සාක්ෂිකාරිය විසින් කරන බවත්ය. 2015.10.06 වෙනි දින **පැ.6** ලෙස ලකුණු කර ඇති ලිපියද තමා විසින් මුද්‍රණය කළ බවද, එහි සැප්තැම්බර් දිනය එසේ පෙන්ඩ්‍රයිව් එකේ තිබූ දිනය වශයෙන් ඒ ආකාරයෙන්ම මුද්‍රණය කළ බව

පවසන ලදී. කෙසේ වෙතත් **පැ.6** දරන ලිපියට අදාළ **පැ.7** දරන ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් තමාට අවබෝධයක් නොමැති බවද පවසන ලදී.

**<u>පැමිණිල්ලේ සාක්ෂි අංක 89</u>**

ප්‍රධාන පොලිස් පරීක්ෂක අලුත්ගේ සෙනරත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයෙකි. 2015.10.13 වන දින ගාලු වරාය පොලීසියට ලද පැමිණිල්ලක් මත MV ඇවන්ට් ගාර්ඩ් නෞකාව සම්බන්ධයෙන් විමර්ශනය ආරම්භ වී ඇත. ඒ අනුව 2015.10.14 වන දින මීට අදාළ විමර්ශනය නියෝජ්‍ය පොලිස්පතිවරයා විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පවරා ඇත. ඒ අනුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2015.10.17 වන දින විමර්ශනය ආරම්භ කර ඇත. එහිදී ඇවන්ට් ගාර්ඩ් නෞකාව තුළ ගිනිඅවි 816 ක් සහ උණ්ඩ දෙලක්ෂ දෙදහස් නවසිය තිස්පහක් තිබී ඇත. ඒ අනුව එවකට ආරක්ෂක ලේකම්වරයා වශයෙන් කටයුතු කළ කරුණාසේන හෙට්ටිආරච්චි මහතාගේ ප්‍රකාශ අවස්ථා දෙකකදී සටහන් කරගෙන ඇති අතර ගාල්ල නාවික හමුදා කඳවුරේ නියෝජ්‍ය ආඥාපති හීනැටිගල, නාවික හමුදාපති වයිස් අද්මිරාල් රවීන්ද්‍ර විජේගුණවර්ධන මහතාගේ ප්‍රකාශයක් සටහන් කරගෙන ඇත.

එසේම සාක්ෂිකරු විසින් ආරක්ෂක අමාත්‍යාංශය විසින් පවත්වාගෙන ගිය MODUD/CS/FA/AT/2013 දරන ලිපි ගොනුව පරීක්ෂා කර ඒ තුළ **පැ.6** දරන ලේඛනය තිබී ඇති අතර ඊට අදාළ ඉල්ලුම් පත්‍රයක් සහ ආවරණ ලිපියක්ද තිබී ඇත. එය **පැ.9** වශයෙන් ලකුණු කරන ලදී. මෙම **පැ.9** දරන ලිපියෙහි දිනය 2015.09.24 වේ. මෙම **පැ.9** දරන ලිපිය ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සර්විසස් සමාගමේ සභාපතිවරයා වන 7 වන චූදිත සහ රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපතිවරයා වූ මියගිය 5 වන චූදිත නමින් ඉදිරිපත් කර තිබී ඇත. එම ලිපියෙහි රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ දින මුද්‍රාව වශයෙන් 2015.09.28 සඳහන් වී ඇත. එහි මුද්‍රාවේ රාජ්‍ය ආරක්ෂක සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් කාර්යාලය වශයෙන් සඳහන් කර තිබූ බව පවසයි. එම අයදුම්පතෙහි රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපති 5 වන චූදිත 2015.09.26 දිනද, ඇවන්ට් ගාර්ඩ් සමාගමේ සභාපති 7 වන චූදිත

2015.09.24 දිනද, ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන් කටයුතු කළ මෙම නඩුවේ 11 වන චූදිතගේ අත්සන 2015.10.06 දිනද සටහන් කර ඇත. එකී ඇයදුම් පත්‍රය **පැ.9(a)** වශයෙන්ද, රක්නා ආරක්ෂක ලංකා සමාගමේ ආයුධ ගබඩාව භාරව සිටි නිලධාරියාගේ අත්සන **පැ.9(b)** වශයෙන්ද ලකුණු කරන ලදී. කෙසේ වෙතත් සාක්ෂිකරු පවසන්නේ තමා කළ විමර්ශනයේදී **පැ.9** දරන ඉල්ලුම් පත්‍රය ආරක්ෂක අමාත්‍යාංශයට ලැබී තිබුණු බව තහවුරු නොවූ බව පවසන ලදී. ඒ සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයට ලැබෙන ලිපි ලේඛන ඇතුලත් කරන පොත පරීක්ෂා කර ඇති අතර එය පැ.8 ලෙස ලකුණු කරන ලදී. එකී ලේඛනයෙහි මෙම අයදුම්පත පිළිබඳව සටහනක් නොමැති බව සාක්ෂිකරු පවසන ලදී. මේ සම්බන්ධයෙන් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ඉනෝකා ප්‍රියදර්ශනී නමැති නිලධාරිනියගේ ප්‍රකාශය සටහන් කරගත් බවද පවසන ලදී.

ඉහත සාක්ෂිකරුවන්ට අමතරව අධිකරණයේ භාෂණ පරිවර්ථක සාක්ෂියට කැඳවා රජයේ රස පරීක්ෂක වාර්තාව **පැ.11** ලෙස ලකුණු කරන ලදී. මෙම පැ.11 දරන රජයේ රස පරීක්ෂක වාර්තාව අනුව රැලි තුවක්කු 816 ක් විමර්ශනයට ලක්කර ඇති අතර පැ.2, පැ.3 සහ පැ.4 ලෙස ලකුණු කර තිබූ රැලි තුවක්කු 552 ස්වයංක්‍රීය ගිනිඅවි බවද පැ.1 හි සඳහන් රැලි තුවක්කු 264 ස්වයංක්‍රීය නොවන ගිනිඅවි බවද වාර්තා කර ඇත. එසේම මෙම කිසිම රැලි තුවක්කුවක අංක වෙනස් කිරීමට ලක්කර නොමැති බවද වාර්තා කර ඇත. පැ.5 සහ පැ.6 ලෙස ලකුණු කර තිබූ සජීවි පතරොම් 202935 පුපුරණ ද්‍රව්‍යය බවද වාර්තා කර ඇත.

**<u>චූදිතයන් විත්තිකූඩුවේ සිට කල ප්‍රකාශ</u>**

**6 වන චූදිත**

මොහු 1985 කැඩෙට් නිලධරයෙකු වශයෙන් යුධ හමුදාවට බැඳි වර්ෂ 2012 දී ලුතිනන් කර්නල්වරයෙකු වශයෙන් විශ්‍රාම ගොස් ඇත. එසේ සිටියදී මිතුරෙකුගෙන් ලද දැනුම මත රක්නා ආරක්ෂක ලංකා සමාගමට සම්බන්ධිකාරක නිලධරයෙකු වශයෙන් බැඳී ඇත. ඉන්පසු වර්ෂ 2015 දී රතු

මුහුදේ පවත්වාගෙන යන ලද ඇවන්ට් ගාර්ඩ් නෞකාවට අනුයුක්ත කර එහි ආයුධ භාරකරු වශයෙන් කටයුතු කර ඇත. 2015.09.21 වන දින රතු මුහුදෙන් පිටත්ව ශ්‍රී ලංකාව වෙත පැමිණ ඇති අතර 2015.10.05 වන දින ජාත්‍යන්තර මුහුදු සීමාවේ සිටියදී 2015.10.06 වන දින නාවික හමුදාව විසින් නැවට ගොඩ වී නැව පරීක්ෂා කර කර ඇත. ඉන්පසු 2015.10.13 වන දින ගාලු වරායට රැගෙනවිත් ඇත. ඉන්පසු විවිධ අවස්ථාවල අපරාධ පරීක්ෂක දෙපාර්තමේන්තුවට විසින් මෙම විත්තිකරුගෙන් ප්‍රකාශ සටහන් කරගෙන 2018.03.28 වන දින අත්අඩංගුවට ගෙන ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර ඇත. තමා රජයට අයත් රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සේවකයෙකු වශයෙන් එම සමාගමේ උපදෙස් මත කටයුතු කළ බවත්, ඔහු වෙත ඉදිරිපත් කරන ලද කිසිදු වරදකට සචේතනිකව හෝ අචේතනිකව දායකත්වයක් දක්වා නොමැති බවත් සඳහන් කරන ලදී.

**7 වන චූදිත**

මොහු ඇවන්ට් ගාර්ඩ් සමාගමේ සභාපතිවරයා වන අතර දීර්ඝ ලෙස ඔහුගේ සුදුසුකම්, කරන ලද රැකියාවන්ට අදාලව ප්‍රකාශය කරන ලද අතර, ඇවන්ට් ගාර්ඩ් සමාගම බිහි කිරීමත්, ඒ සම්බන්ධයෙන් රක්නා ආරක්ෂක ලංකා සමාගම අතර ඇතිවූ ගිවිසුමත්, රතු මුහුදේ පවත්වාගෙන යන ලද පාවෙන අවි ගබඩා සම්බන්ධයෙන් දීර්ඝ ප්‍රකාශයක් කරන ලදී. රක්නා ආරක්ෂක ලංකා සමගාම සමග ඒකාබද්ධව පාවෙන අවි ගබඩාව පවත්වාගෙන යෑම ආරක්ෂක අමාත්‍යාංශයේ අනුමැතිය මත නීත්‍යානුකූලව කරගෙන ගිය බව පවසන ලදී. මේ සම්බන්ධයෙන් මෙම ව්‍යාපෘතියට ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් තිබුණු බවද තමාට විරුද්ධව ද්වේශ සහගත ලෙස නඩු පවරා ඇති බව පවසන ලදී. එසේම රතු මුහුදේ තිබී ඇවන්ට් ගාර්ඩ් පාවෙන අවි ගබඩාව සහිත යාත්‍රාව ශ්‍රී ලංකාවට පැමිණීමට පෙර වර්ෂ 2015.09.24 වන දින නීත්‍යානුකූලව ඉල්ලීමක් රක්නා ආරක්ෂක සමාගමට ඉදිරිපත් කළ බවත්, ආරක්ෂක අමාත්‍යාංශයෙන් යම් ආකාරයක ප්‍රමාදයක් සිදුවී ඇති බව පවසන ලදී.

**8 වන චූදිත**

මෙම චූදිතද 1984.01.11 වන දින සිට නාවික හමුදාවට බැඳී වර්ෂ 2004.02.01 වන දින කොමදෝරුවරයෙක් වශයෙන් විශ්‍රාම ගොස් ඇත. 2012 වසරේ ඇවන්ට් ගාර්ඩ් සමාගමට බැඳී MV ඇවන්ට් ගාර්ඩ් නෞකාවේ සේවය කරමින් සිටින විට පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දුන් කොමදෝරු ජිනදාස තමාට දුරකතනයෙන් කතා නොකරන ලද බව පවසන ලදී. එසේම කිසිදු අවස්ථාවක තමා සිටි නෞකාවේ අවි ආයුධ සහ පතරොම් නොමැති බව ප්‍රකාශ නොකල බවත් පවසන ලදී.

**9 වන චූදිත**

මෙම චූදිත ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවය කරමින් සිටියදී පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වී ඇත. එසේ සිටියදී වර්ෂ 2012 දී සීමාසහිත ඇවන්ට් ගාර්ඩ් සමාගමේ රැකියාවක් ලැබී ඇවන්ට් ගාර්ඩ් නෞකාවේ සේවය කරන ලද බව පවසන ලදී.

**10 වන චූදිත**

MV ඇවන්ට් ගාර්ඩ් නෞකාවේ කපිතාන්වරයා වූ මොහු යුක්‍රේන ජාතිකයෙකි. ඔහු කපිතාන් ධූරය සඳහා සුදුසුකම්, වෘත්තීය අත්දැකීම් දීර්ඝ ලෙස ප්‍රකාශ කල අතර 2015 දී දුරකතනය මාර්ගයෙන් සාකච්ඡා කර ශ්‍රී ලංකා ෂිපිං ලයින්ස් ආයතනයේ රැකියාවට බැඳී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා ෂිපිං ලයින්ස් ආයතනයත්, ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සර්විසස් සමාගමත් අතර ඇති වූ ගිවිසුමක ප්‍රතිඵලයක් වශයෙන් රතු මුහුදේ පාවෙන අවි ගබඩාවක් වශයෙන් පවත්වාගෙන ගිය MV ඇවන්ට් ගාර්ඩ් නෞකාවේ කපිතාන්වරයා වශයෙන් කටයුතු කිරීමට එකඟ වී ඇත. මෙම ඇවන්ට් ගාර්ඩ් සමාගම ශ්‍රී ලංකා රජයට අයත් රක්නා ආරක්ෂක ලංකා සමාගම සමග ගිවිසුම් ගත වී ඇති බවත් දන්වා ඇත. ඒ අනුව 2015.07.26 වන දින ගුවනින් සුඩානයට ගොස් එතැනින් අධිවේගී බෝට්ටුවකින් විවෘත මුහුදේ තිබූ ඇවන්ට් ගාර්ඩ් නෞකාවට ගොඩවී ඇත. එම නැව තුල තිබී

අවි ආයුධ සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම ඇල්බට් මහතා සතු වූ බවත්, ඒවායෙහි යතුරු ඇල්බට් මහතා සතුව තිබූ බවත් පවසන ලදී. නැවේ ප්‍රධානියා වශයෙන් නිලුපුල් ද කොස්තා කටයුතු කල බවත්, කපිතාන්වරයා වශයෙන් ආයුධ ගබඩාවට ප්‍රවේශ වීමට හෝ එය විවෘත කිරීමට කිසිදු අයිතියක් තමාට නොමැති බව පවසන ලදී. වැඩිදුරටත් ඔහු අත්අඩංගුවට පත්වීම සහ මෙම නඩුව හේතුවෙන් තමාට පුද්ගලිකව සිදුවී ඇති අපහසුතාවන් සම්බන්ධයෙන් දීර්ඝ ලෙස ප්‍රකාශ කරන ලදී.

## 11 වන චූදිත

මොහු ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු වන අතර 2015.10.06 වන විට ආරක්ෂක අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා වශයෙන් කටයුතු කර ඇත. එහිදී රක්නා ආරක්ෂක ලංකා සමාගම සහ ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සමාගම අතර මෙහෙයුම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට භාරදී ඇත. ආරක්ෂක අමාත්‍යාංශයේ සිවිල් ආරක්ෂක සහ සංවර්ධන අංශයට දිනකට ලිපි 150 ක් පමණ ලැබෙන බවත්, මෙම සියලු ලිපි ලේඛන ගතවීම අත්‍යාවශ්‍ය නොවන බවත් පවසන ලදී. කිසිදු අවස්ථාවක ලිපි ලේඛන සැකසීමට තමාට අරමුණක් නොතිබුණු බවත්, එසේ අවශ්‍ය වුයේ නම් 5 වෙනිදා ලෙස ලිපි නිකුත් කිරීමට හැකියාවක් තිබූ බවත් පවසන ලදී. එසේම මෙම සිද්ධිය සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වන ලද විනය පරීක්ෂණයේදීද තමා වරදක් නොකරන ලද බව තීරණය කර ඇති බව පවසන ලදී.

## 13 වන චූදිත

මොහු තම රාජ්‍ය සේවයේ වසර 34 ක සේවා කාලය පිළිබඳ දීර්ඝ පැහැදිලි කිරීමක් කල අතර, 2015.04.23 දින සිට 2016.12.27 දක්වා රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපති වශයෙන් කටයුතු කල බව පවසන ලදී. රක්නා ආරක්ෂක ලංකා සමාගම සතුව ඇති සියලුම අවි ආයුධ සහ පතරොම් ත්‍රිවිධ හමුදාවට සහ පොලිසියට අයත් ඒවා බවත්, ඒවා නීතිවිරෝධී අවි ලෙස සැලකිය නොහැකි බවත් පවසන ලදී. මෙම නඩුවට පශ්නුත අවි ආයුධ සහ පතරොම් නිසි අවසරයක් මත රතු මුහුදට රැගෙන ගොස් නැවත දිවයිනට ගෙන ඒමේදී අවශ්‍ය

අනුමැතිය ලබාගැනීම සඳහා විධිමත් ඉල්ලීමක් ඉදිරිපත් කර තිබූ බව පවසන ලදී. 2019.07.05 වන දින රූපවාහිනී ප්‍රවෘත්ති මගින් තමා අත්අඩංගුවට ගැනීමට උපදෙස් දී ඇති බව ප්‍රචාරය වීම නිසා 2019.07.08 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ගොස් ඉදිරිපත් වූ බව පවසන ලදී. ඒ වන විට තමා අත්අඩංගුවට ගැනීමට නීතිපති උපදෙස් ලැබී නොතිබුණු නමුත් එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කළ ශානි අබේසේකර මහතා සෙනරත් නැමති නිලධාරියා මාර්ගයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමසූ විට තමාගේ ප්‍රකාශයක් ලබාගැනීමට උපදෙස් දී ඇති බව පවසා, එම ප්‍රකාශය සටහන් කරගැනීමෙන් පසු අත්අඩංගුවට ගෙන ගාල්ල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර මාස 2 කුත් දින 18 ක් රක්ෂිත බන්ධනාගාරගතව සිටි බව වැඩිදුරටත් පවසන ලදී. තමා රජයට අයත් රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපතිවරයා වීම මතම මෙසේ අත්අඩංගුවට ගෙන බන්ධනාගාරගත කිරීම දැඩි අසාධාරණයක් බව ඔහුගේ ස්ථාවරයයි.

නඩු විභාගයේදී පහත සඳහන් කරුණු අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 420 වගන්තිය යටතේ පිළිගැනීම් ලෙස සටහන් කරන ලදී.

1. 2015 ඔක්තෝම්බර් 06 වන දින පැය 09.15 ට ශ්‍රී ලංකාවට ආසන්න ජාත්‍යන්තර ජල තීරයේ සිට නාවික සැතපුම් 15 ක් දුරින් ජාත්‍යන්තර මුහුදේ තිබියදී MV ඇවන්ට් ගාර්ඩ් නෞකාව ශ්‍රී ලංකා නාවික හමුදාවේ ලුතිනන් ඩබ්.එච්.පී.වීරසිංහ ඇතුළු කණ්ඩායමක් විසින් නාවික හමුදාව භාරයට ගත් බව.
2. එම නැව භාරයට ගන්නා අවස්ථාවේදී නැවේ කපිතාන්වරයා වශයෙන් 10 විත්තිකාර ගෙනඩි ග්‍රැච්රිලොව් කටයුතු කළ බව.
3. එසේ නැව භාරයට ගත් අවස්ථාවේදී එම නැව තුළ අනෙකුත් උපකරණ අතර ජීව උණ්ඩ ප්‍රමාණයක් තිබුණු බව.
4. ඉහත කී ඇවන්ට් ගාර්ඩ් නෞකාව නාවික හමුදාව භාරයට ගත් අවස්ථාව වන විට රතු මුහුදේ සිට ගමන ආරම්භ කර තිබූ බව.
5. එසේම එම නැව භාරයට ගත් අවස්ථාවේදී එම නැව තුළ 06 වන සහ 09 චූදිතයින් ඇතුළු තවත් ශ්‍රමිකයින් 33 දෙනෙකු සිටි බව.

6. MV ඇවන්ට් ගාර්ඩ් නෞකාව නාවික හමුදාව භාරයට ගත් අවස්ථාව වන විට ශ්‍රී ලංකා රජය යටතේ ලියාපදිංචි කර තිබූ නෞකාවක් බව.
7. 2012.03.19 වන දිනැතිව අංක 322 දරන බද්ධ ව්‍යාපාර ගිවිසුම අනුව සීමා සහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම සහ ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සිකියුරිටි සමාගම අතර පාවෙන අවි ගබඩාව ස්ථාපනය කිරීම සහ පවත්වාගෙන යෑම පිළිබඳව දෙපාර්ශවය එකඟතාවයකට පැමිණ තිබීම .
8. 2015.10.06 දින වන විට MV ඇවන්ට් ගාර්ඩ් නෞකාව, නාවික හමුදාව භාරයට ගත් අවස්ථාවේදී නැව තුළ සිටි 08 වන විත්තිකරු සහ 09 වන විත්තිකරු පිළිවෙලින් සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සහ ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සිකියුරිටි සමාගමේ සේවකයන් වශයෙන් කටයුතු කිරීම.
9. එකී නැව අත්අඩංගුවට ගත් අවස්ථාවේදී නෞකාවේ කාර්ය මණ්ඩලය යටතේ සිටි 33 දෙනෙකුගේ නම් ඇතුළත් ලේඛනය 10 වන විත්තිකරු විසින් අත්සන් කර පැමිණිල්ලේ සාක්ෂි අංක 02 ට භාරදීම.
10. MVඇවන්ට් ගාර්ඩ් නෞකාව ශ්‍රී ලංකා ෂිපිං කෝප්පරේෂන් පුද්ගලික සමාගමට අයත් නැවක් වශයෙන් ඇවන්ට් ගාර්ඩ් සමාගමට ගිවිසුමක් යටතේ බදු දී ඇති බව.
11. 5 වි 1 ලෙස ලකුණු කරන ලද ලේඛනයේ පැමිණිල්ලේ සාක්ෂි අංක 19 ගේ නම සටහන්ව තිබීම.
12. පැමිණිල්ලේ සාක්ෂි අංක 19 අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ප්‍රකාශයක් දී නොතිබීම.
13. 2015.10.06 දින වන විට 13 වන චූදිත සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපති වශයෙන් කටයුතු කළ බව.
14. 2015.10.06 වන විට 07 වන චූදිත සීමා සහිත ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සර්විසස් සමාගමේ සභාපති වශයෙන් කටයුතු කළ බව.
15. 11 වි 2 වශයෙන් ලකුණු කරන ලද අයදුම් පත්‍රයේ සීමා සහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම වෙනුවෙන් 2015.09.26 වන දින පස්වන චූදිත අත්සන් තබා ඇති බව.

16. 11 වි 2 දරන ලේඛනයේදී ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සිකියුරිටි සර්විසස් සමාගම වෙනුවෙන් 2015.10.24 දින 07 වන චූදිත අත්සන් කර ඇති බව සහ 2015.10.06 දින ඊට අනුමැතිය ලබාදෙමින් 11 වන චූදිත අත්සන් තබා ඇති බව.
17. පැ.6 නොඑසේ නම් 5 වි 18 දරන ලිපිය 11 වන චූදිත විසින් ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන් අත්සන් තබා ඇති බව.
18. පැමිණිල්ල විසින් අධිකරණයට ඉදිරිපත් කර ඇති ජංගම දුරකතනයේ ප්‍රශ්න ගත කෙටි පණිවිඩය අන්තර්ගත නොවන බව.
19. 2016.06.23 වන දින ප්‍රධාන පොලිස් පරීක්ෂක ලසන්ත රත්නායක විසින් 10 වන චූදිත අත්අඩංගුවට ගැනීම සහ ඔහුගේ ප්‍රකාශය උපපොලිස් පරීක්ෂක සුසන්ත විසින් සටහන් කරගැනීම.
20. 2018.03.29 දින ප්‍රධාන පොලිස් පරීක්ෂක ලසන්ත රත්නායක විසින් 06 වන චූදිත ඇල්බට් තිලකරත්න අත්අඩංගුවට ගැනීම සහ ඔහුගේ ප්‍රකාශය පොලිස් කොස්තාපල් 67445 සෙනරත් විසින් සටහන් කරගැනීම .
21. 2018.04.26 වන දින පොලිස් පරීක්ෂක සෙනරත් විසින් 09 චූදිත අත්අඩංගුවට ගැනීම සහ ඔහුගේ ප්‍රකාශය සටහන් කරගැනීම.
22. 2019.07.08 වන දින පොලිස් පරීක්ෂක සෙනරත් විසින් 13 වන චූදිත අත්අඩංගුවට ගැනීම සහ ඔහුගේ ප්‍රකාශය සටහන් කරගැනීම.
23. 2019.07.18 වන දින පොලිස් පරීක්ෂක සෙනරත් විසින් 11 වන චූදිත අත්අඩංගුවට ගැනීම සහ ප්‍රකාශය සටහන් කරගැනීම.
24. 2019.09.27 වන දින පොලිස් පරීක්ෂක හේවාවඩු විසින් 08 වන චූදිත අත්අඩංගුවට ගැනීම සහ ඔහුගේ ප්‍රකාශය කාන්තා උපපොලිස් පරීක්ෂක ශෂිකලා රණසිංහ විසින් සටහන් කරගැනීම.
25. 2019.10.17 වන දින පොලිස් පරීක්ෂක හේවවඩු විසින් 07 වන චූදිත අත්අඩංගුවට ගැනීම සහ ඔහුගේ ප්‍රකාශය රන්ජිත් විසින් සටහන් කරගැනීම.
26. 10 වි 8 දරන ලේඛනය සහ එහි අන්තර්ගතය සහ එම ලේඛනය 09 වන පිළිගැනීමට අදාල ලේඛනය බව.

27. 10 වි 9 දරන ලේඛනය සහ එහි අන්තර්ගතය සහ එකී ලේඛනය 2 වන පිළිගැනීමට අදාල බව.
28. 10 වි 10 ලේඛනය සහ එහි අන්තර්ගතය සහ එම ලේඛනය 6 වන පිළිගැනීමට අදාල බව.
29. 10 වන චූදිතට යුක්රේන රජයෙන් නිකුත් කරන ලද අංක ET 443708 දරන විදේශ ගමන් බලපත්‍රය සතුව තිබීම සහ අංක AD 464900 දරන නාවික හැඳුනුම්පත සතුව තිබීම සහ එකී ලේඛන 10 වන චූදිත අත්අඩංගුවට ගත් අවස්ථාවේදී පොලිස් භාරයට ගැනීම.

<u>**නඩුවට අදාල සිද්ධිමය පසුබිම**</u>

මෙම නඩුවට අදාල සාක්ෂි හා නීතිමය තත්ත්වය සාකච්ඡා කිරීමට පෙර මීට අදාල පසුබිම කෙටියෙන් සාකච්ඡා කිරීම සුදුසු බවට අපි තීරණය කරමු. එහිදී පාවෙන අවි ගබඩාවක් යනු කුමක්ද යන්න හා එහි ඉතිහාසය සළකා බලමු. ලෝකයේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා වෙළඳ නැව් විශාල වශයෙන් ක්‍රියාත්මක වන අතර ඉන්දියානු සාගරයේ මෙන්ම රතු මුහුද ආශ්‍රිතව විශාල වශයෙන් එකී මුහුදු නැව්, මුහුදු කොල්ලකරුවන්ගේ ප්‍රහාරයට ලක් වීම හේතුවෙන් එය ලෝක ආර්ථිකයට තර්ජනයක් විය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වෙළඳ නැව් ඉහතින් සඳහන් කරන ලද අනාරක්ෂිත මුහුදු තරණය කරන අවස්ථාවන් හිදී පුද්ගලික මුහුදු ආරක්ෂක සමාගම් (Private Maritime Security Companies) වල සහාය ලබා ගැනීමට සිදු විය. එහිදී අවි ආයුධ සහ ආරක්ෂකයින් මගින් ආරක්ෂාව සපයන මුහුදු ආරක්ෂක සමාගම්වලට අයත් නෞකා විදේශීය වරායන් වලට පැමිණීමේදී එකී විදේශීය වරායන් අයත් රාජ්‍යයන්ගේ ආරක්ෂාවට තර්ජනයක් වන්නේය යන පදනම මත එකී නෞකා වලට වරායන්වලට ඇතුල් වීමට අවසර නොදෙන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් ජාත්‍යන්තර මුහුදේ රඳවා තබනු ලබන පාවෙන අවි ගබඩාවල එකී අවි ආයුධ සහ ආරක්ෂකයන් රඳවා වෙළඳ නැව් වරායන් තුළට ඇතුලත් කිරීමත්, නැවත වතාවක් ජාත්‍යන්තර මුහුදේ

ධාවනය කරන විට පාවෙන අවි ගබඩාවලින් අවි ආයුධ ලබා ගැනීමත් ජනප්‍රිය වන්නට විය. මෙසේ ජාත්‍යන්තර මුහුදේ ගමන් කරන වෙළඳ නැව්වලට ආරක්ෂාව සැපයීමේ කාර්යය ආරම්භයේදී ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් සිදුකර ඇත. පසුකාලීනව ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගත් තීරණයක් පරිදි මෙම ක්‍රියාන්විතය ඇවන්ට් ගාර්ඩ් සමාගම සහ රක්නා ලංකා ආරක්ෂක සමාගම ඒකබද්ධව වූ ව්‍යාපාරයකට පවරා ඇත. මෙම නඩුවට අදාල වී ඇති MV ඇවන්ට් ගාර්ඩ් නෞකාව පාවෙන අවි ගබඩාවක් රතු මුහුදේ පවත්වාගෙන ගොස් ඇත. එම නෞකාව රතු මුහුදේ සිට ගාලු වරායට පැමිණ ඇති අතර ගාලු වරායට ඇතුල් වීම සඳහා ඊට නුදුරින් වූ ජාත්‍යන්තර මුහුදේ නවතා තිබියදී 2015.10.05 වන දින ශ්‍රී ලංකා නාවික හමුදාව භාරයට ගෙන ඇත. එසේ භාරයට ගන්නා අවස්ථාවේදී එකී නැව තුළ වූ ගිනිඅවි සහ ජීව උණ්ඩ සම්බන්ධයෙන් මෙම නඩුව පවරා තිබූ අතර මේ වනවිට මෙම නඩුව පවත්වාගෙන යනු ලබන්නේ ඒ තුළ වූ ජීව උණ්ඩ සහ එකී ජීව උණ්ඩ වලට අදාලව සහ **පැ.9(a)** දරන අයදුම් පත්‍රයෙහි වලංගු භාවය සම්බන්ධයෙන් පමණි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා ආණ්ඩුව ගත් මෙම තීරණයට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ඇතැම් නිලධාරීන් තුළ කැමැත්තක් තිබී නොමැති බව පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දුන් එවකට නාවික හමුදාපති වශයෙන් කටයුතු කළ රවීන්ද්‍ර විජේගුණවර්ධන මහතාගේ සාක්ෂියෙන් පැහැදිලි වේ. කෙසේ වෙතත් අප රට තුළ පමණක් නොව ජාත්‍යන්තර වශයෙන්ද මෙම පාවෙන අවි ගබඩා සම්බන්ධයෙන් නීති තත්ත්වය තුළ අඩුලුහුඩුකම් මෙන්ම ප්‍රශ්නකාරී අවස්ථාද ඇති විය. මේ පිළිබඳව පසුව සාකච්ඡා කරමු.

**<u>සාක්ෂි විශ්ලේෂණය</u>**

පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි, චූදිතයන් විසින් විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයන් සහ වාර්තා ගත කරන ලද පිළිගැනීම් සලකා බැලීමේදී මෙම නඩුවේදී ප්‍රධාන වශයෙන් සලකා බැලිය යුතු කරුණු වන්නේ 7549, 7560 සහ 7571 අධිචෝදනා වේ.සෙසු අධිචෝදනා ඉහත අධිචෝදනා තුනට අදාළව ආධාර හා අනුබල දීම සම්බන්ධයෙන් පමණක් ඉදිරිපත් කර ඇත.

7549 සහ 7560 දරන අධිචෝදනා දෙක 10 වන චූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇති අතර 7571 චෝදනාව 11 වන චූදිතට එරෙහිව ඉදිරිපත් කර ඇත.

වාචික දේශන ඉදිරිපත් කරන අවස්ථාවේදී පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි උගත් ජොෂ්ඨ රජයේ අධිනීතිඥවරයා පහත කරුණු කෙරෙහි අධිකරණයේ අවධානය යොමු කරන ලදී.

01. මෙම අධිකරණයට ඉදිරිපත් කර ඇති තොරතුරු වාර්තාවේ සඳහන් චෝදනා පදනම් කර ගත්තේ පුද්ගල මණ්ඩලවල අපරාධ වගකීම **(Corporate criminal liability)** මත පදනම්ව යන්න,

02. MV ඇවන්ට් ගාර්ඩ් නෞකාව 2015.10.05 වන දින ගාලු වරායට ලඟා වුවද ඊට පෙර රතු මුහුදේ සිට ගමන ආරම්භ කර ඇති හෙයින් ශ්‍රී ලංකා ධජය දරන නෞකාවක් වශයෙන් එහි සඳහන් පුපුරණ ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා එකී දිනයන්ට අදාල බලපත්‍රයක් නොමැති බව සාක්ෂි මගින් ඔප්පු වී තිබීම.

03. 2015.10.06 දිනැතිව රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඉදිරිපත් කර ඇති **පැ. 6** දරන ලිපියට අදාලව වලංගු ඉල්ලුම් පත්‍රයක් ආරක්ෂක අමාත්‍යාංශයට ඉදිරිපත්ව නොමැති හෙයින් පැ.9(a) දරන ලේඛනය ව්‍යාජ ලෙස සකසා පසුව ඇතුළත් කර ඇති බව.

චූදිතයන් වෙනුවෙන් ඉදිරිපත් කරන ලද දේශන සමස්ථයක් ලෙස සළකා බැලීමේදී පහත සඳහන් නීති තර්ක ඉදිරිපත් විය.

01. පැමිණිල්ලේ සාක්ෂි අංක 35, අධිචෝදනාවල සඳහන් දිනයන්ට අදාලව පුපුරණ ද්‍රව්‍ය පාලකවරයා වශයෙන් කටයුතු කළ හෙයින් **පැ.6** දරන ලිපිය *nunc pro tunc* සිද්ධාන්තය යටතේ ගමන ආරම්භයේ සිට වලංගු වන බව.

02. රක්නා ආරක්ෂක ලංකා සමාගම ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වන ආයතනයක් වන හෙයින් හා එකී සමාගම සහ ඇවන්ට් ගාර්ඩ් සමාගම අතර වන ගිවිසුම වලංගු ගිවිසුමක් වන හෙයින් එකී සමාගම් යටතේ

සේවය කළ 6, 8, 9 සහ10 වූදිතයන්ට සිද්ධිමය වැරදීම නමැති විත්තිවාචකයේ රැකවරණය ලැබිය යුතු බව.

03. 2005 අංක 18 පනතින් සංශෝධිත පුපුරණ ද්‍රව්‍ය පනතේ 30 වන වගන්තිය අනුව එකී පුපුරණ ද්‍රව්‍ය, පුපුරණ ද්‍රව්‍යය පාලකවරයා වන ආරක්ෂක ලේකම්වරයා සඳහා හෝ ඔහු වෙනුවෙන් දැරීමේ පදනම මත එකී ජීව උණ්ඩ ලඟ තබා ගැනීම සඳහා බලපත්‍රයක් අවශ්‍ය නොවීම.

04. පුපුරණ ද්‍රව්‍ය පනතේ 9(2) වගන්තිය යටතේ අධිචෝදනා සලකා බැලීමේදී එකී පනතේ 10 වන වගන්තිය අනුව ඔප්පු කළ යුතු අත්‍යාවශ්‍ය අංග පැමිණිල්ල විසින් ඔප්පු කර නොතිබීම.

පැමිණිල්ල වෙනුවෙන් කැඳවන ලද සාක්ෂිකරුවන්ගේ සාක්ෂි, වාර්තා කරන ලද පිළිගැනීම් සියල්ල සලකා බැලීමේදී MV ඇවන්ට් ගාර්ඩ් නෞකාව රතු මුහුදේ සිට ගාලු වරාය දක්වා ගමන් කර ඇති බව පැහැදිලිය. MV ඇවන්ට් ගාර්ඩ් නෞකාව තුළ තිබූ මෙම නඩුවේ අධිචෝදනාවන්ට අදාල ජීව උණ්ඩ සියල්ල රක්නා ආරක්ෂක ලංකා සමාගම සතු බවට විවාදයක් නැත. පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරයාගේ ප්‍රධාන තර්කය වන්නේ මෙම ජීව උණ්ඩ ප්‍රවාහනය සඳහා පුපුරණ ද්‍රව්‍යය පාලකවරයාගෙන් ලබාගත් වලංගු බලපත්‍රයක් නොතිබුණේය යන්නයි. එහිදී මුලින්ම පුපුරණ ද්‍රව්‍ය පනතේ ප්‍රතිපාදන අනුව මෙම කාර්යය සඳහා බලපත්‍රයක් අවශ්‍යද නොඑසේ නම් විත්තිය විසින් තර්ක කරන පරිදි එකී පනතේ 30 වන වගන්තිය අනුව බලපත්‍රයක් අවශ්‍ය නොවන්නේද යන්න සලකා බලමු. මුලින්ම පහසු පරිශීලනය සඳහා එකී 30 වන වගන්තිය පහතින් උපුටා දක්වමු.

**"30(1) මේ පනතේ විධිවිධාන සන්නද්ධ හමුදා මගින්, පොලිස් බලකාය මගින්, රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මගින් හෝ පුපුරණ ද්‍රව්‍ය පාලකවරයා සඳහා හෝ ඔහු වෙනුවෙන් දරනු ලබන පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් අදාල නොවිය යුතුය."**

මෙහිදී පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දුන් එවකට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් කටයුතු කළ කරුණාසේන හෙට්ටිආරච්චි

මහතා පැහැදිලිව පවසා සිටියේ ඇවන්ට් ගාර්ඩ් සමාගම සහ රක්නා ආරක්ෂක ලංකා සමාගම ඒකාබද්ධව රතු මුහුදේ පවත්වාගෙන ගිය පාවෙන අවි ගබඩාව සම්පූර්ණ නීත්‍යානුකූල ක්‍රියාන්විතයක් බවයි. එසේම ඇවන්ට් ගාර්ඩ් සමාගමට ගිනිඅවි තබා ගැනීමට හැකියාවක් නොමැති හෙයින්, ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පිහිටුවා ඇති රජය සතු සමාගමක් වන රක්නා ආරක්ෂක ලංකා සමාගමට මෙම ගිනිඅවි සහ ජීව උණ්ඩ තබා ගැනීමට බලය දී ඇති බවයි. එසේම ප්‍රධාන විමර්ශන නිලධාරියා වන පැමිණිල්ලේ සාක්ෂි අංක 89 ප්‍රධාන පොලිස් පරීක්ෂක අලුත්ගේ සෙනරත් පවසා සිටියේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියමය මත රක්නා ආරක්ෂක ලංකා සමාගමට ගිනිඅවි නිකුත් කිරීම ශ්‍රී ලංකා යුද්ධ හමුදාව, ගුවන් හමුදාව සහ නාවික හමුදාව විසින් සිදු කර ඇති බවත්, ඇතැම් ආයුධ රක්නා ආරක්ෂක ලංකා සමාගම විසින් මිලදී ගෙන ඇති බවත්ය.

මේ සම්බන්ධයෙන් 13 වන විත්තියේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ප්‍රධාන විමර්ශන නිලධාරියා වූ පැමිණිල්ලේ සාක්ෂි අංක 89 ප්‍රධාන පොලිස් පරීක්ෂක අලුත්ගේ සෙනරත් 2020.09.24 වන දින විභාග සටහන්වල පස්වරු 3.50 සටහනේ 10 වන පිටුවේ පළවන ප්‍රශ්නයට දී ඇති පිළිතුර වැදගත් වේ.

ප්‍ර :- **තමන් තහවුරු කර ගත්තාද රැල් සමාගම රජයේ නීත්‍යානුකූල ව්‍යාවසායක්, ආරක්ෂක අමාත්‍යංශය යටතේ තිබෙන්නේ අවි දැරීමේ හැකියාව තිබෙනවා. ආරක්ෂක අමාත්‍යංශයේ අනුමැතිය මත එහි තිබෙන අවි හමුදාවේ පොලීසියේ, නාවික හමුදාවේ අවි කියලා තමුන් තහවුර කර ගත්තාද?**

උ :- **නාවික හමුදාවෙත් පොලීසියෙත් යුධ හමුදාවෙත්, ගුවන් හමුදාවෙත් අවි සහ උණ්ඩ කියලා තහවුරු කර ගත්තා ස්වාමීණී. ඒවාගේම මේවා රක්නා ආරක්ෂක ලංකා සමාගම විසින් ඇතැම් අවි සහ පතොරම් මිළදි ගෙන ඇති බව තහවුරු කර ගත්තා ස්වාමීණී.**

පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් වූ පුපුරණ ද්‍රව්‍ය පනතේ ආකෘති පත්‍ර සහ ඉල්ලුම් පත්‍ර සලකා බැලීමේදී **පැ.9(a)** ඉල්ලුම් පත්‍රය එම ආකෘති වලින් බැහැරව

ඇති ඉල්ලුම් පත්‍රයක් බව පැහැදිලිය. පුපුරණ ද්‍රව්‍ය පනත යටතේ නිකුත් කර ඇති රෙගුලාසිවල සඳහන් කර ඇත්තේ සෑම අයදුම් පත්‍රයක්ම එහි සඳහන් ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතු බවයි. කෙසේ වෙතත් පැමිණිල්ල විසින් පැ.9(a) ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති අයදුම් පත්‍රය සහ පැ.6 ලෙස ලකුණු කර ඇති අවසර පත්‍රය යන කිසිවක් පුපුරණ ද්‍රව්‍ය ආඥා පනතේ උපලේඛනයේ සඳහන් ආකෘතීන් අනුව ඉදිරිපත් වී නොමැති බව අපි නිරීක්ෂණය කරමු.

වර්ෂ 2020.01.17 දින මෙම ත්‍රිපුද්ගල විනිසුරු මඩුල්ල විසින් තීරණය කලේද පුපුරණ ද්‍රව්‍ය පනත යටතේ අයදුම් පත්‍රයක් ඉදිරිපත් කළ හැක්කේ සහ අවසර පත්‍රයක් ලබා දිය හැක්කේ ස්වභාවික පුද්ගලයෙකුට විනා නෛතික පුද්ගලයෙකුට නොවන බවයි. එම නියෝගය මේ වනවිටද වලංගුව පවතින අතර එය කිසිදු ඉහළ අධිකරණයක අභියෝගයට ලක් වී නැත.

මින් පෙනී යන්නේ රක්නා ආරක්ෂක ලංකා සමාගම සතුව පවතින ගිනිඅවි සහ ජීව උණ්ඩ සියල්ල ආරක්ෂක අමාත්‍යාංශය සතු ගිනිඅවි සහ ජීව උණ්ඩ බවයි.

එබැවින් MV ඇවන්ට් ගාර්ඩ් නෞකාවේ තිබූ මෙම අධිචෝදනාවලට අදාළ ජීව උණ්ඩ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වන පූර්ණ වශයෙන් රජයට අයත් සමාගමක් වූ රක්නා ආරක්ෂක ලංකා සමාගම භාරයේ, පුපුරණ ද්‍රව්‍ය පාලකවරයා වූ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුදැනුම මත තිබූ ඒවා වන හෙයින්, ඒ සඳහා පුපුරණ ද්‍රව්‍ය පනතේ 30(1) වගන්තිය අනුව වෙනම බලපත්‍රයක් ලබා ගැනීම අවශ්‍ය නොවන බවට අපි තීරණය කරමු.

නමුත් ගැටළුව මතු වනුයේ එවැනි අවසර පත්‍රයක් 30 වන වගන්තියේ විධිවිධාන අනුව අවශ්‍ය නොවනුයේ නම් **පැ.9(a)** දරන අයදුම් පත්‍රය ඉදිරිපත් කර ඇත්තේ කුමන කාර්යයක් සඳහාද යන්නයි. මේ සම්බන්ධයෙන් විත්තිය විසින් කරුණු දක්වමින් පවසා සිටියේ 30 වන වගන්තිය යටතේ නිත්‍යානුකූල අවසර පත්‍රයක් අවශ්‍ය නොවුණද පරිපාලනමය ක්‍රියාවල පහසුව සඳහා එවැනි අවසර පත්‍රයක් ලබා ගන්නා බවයි. විශේෂයෙන්ම යම්කිසි නැවක් වරායකට ඇතුලත් කිරීමේදී ප්‍රායෝගිකව මේ සම්බන්ධයෙන් කරුණු හෙළිදරව් කළයුතු වන

හෙයින් එකී ක්‍රියාපටිපාටිය සඳහා මේ ආකාරයට ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර අවසරයක් ලබා ගැනීම සාමාන්‍යයෙන් සිදු කරන බව පවසන ලදී. මෙම තත්වය **පැ.9(a)** දරන ඉල්ලුම් පත්‍රය සහ **පැ.6** දරන අවසර පත්‍රය යන ලේඛන දෙකම පිටපත් කර ඇත්තේ ශ්‍රී ලංකා නාවික හමුදාවට, ශ්‍රී ලංකා වරාය අධිකාරියට සහ ශ්‍රී ලංකා රේගුවට යන කරුණු සලකා බැලීමේදී පැහැදිලි වේ.

ඉහත සඳහන් නීතිමය තත්ත්වය එසේම තිබියදී MV ඇවන්ට් ගාර්ඩ් නෞකාවට ගිනිඅවි සහ පුපුරණ ද්‍රව්‍ය ප්‍රවාහනය සඳහා බලපත්‍රයක් අවශ්‍ය වන්නේ යැයි මදකට උපකල්පනය කරමු.

ආරක්ෂක ලේකම් කරුණාසේන හෙට්ටිආරච්චිගේ සාක්ෂියෙන්ද තහවුරු වනුයේ එවැනි අවසර පත්‍රයක් නිකුත් කිරීමට තමා කටයුතු කරන ලද්දේ මෙම ආයුධ හා පුපුරණ ද්‍රව්‍ය ශ්‍රී ලංකා රජයට අයත් සහ රාජ්‍ය ආයතනයක් වූ රක්නා ලංකා සමාගමේ අවි ආයුධ වන බැවින් තමා එය නිකුත් කිරීමට අදාල ඉල්ලුම් පත්‍රයේ විධිවිධානද සලකා බලා කටයුතු කළ බවයි.

පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දුන් නිලන්ත හීනැටිගල, විදාන ගමගේ ප්‍රදීප් වීරසිංහ, මනෝහර බණ්ඩාර වැත්තැව සහ රවීන්ද්‍ර චන්ද්‍රසිරි විජේගුණවර්ධන යන සාක්ෂිකරුවන් සාක්ෂි දෙමින් ප්‍රශ්නගත MV ඇවන්ට් ගාර්ඩ් නෞකාව රතු මුහුදෙන් ගමනාරම්භ කිරීමේ සිට ගාලු වරායට නැංගුරම්ලෑම දක්වා වූ ක්‍රියාවලිය, ගාලු වරායේදී නෞකාව පරීක්ෂා කිරීම, නෞකාව තුළ තිබී සොයාගත් ගිනිඅවි සහ පුපුරණ ද්‍රව්‍ය පිළිබඳ විස්තර යනාදී කරුණු විස්තරාත්මකව පැහැදිලි කරන ලදී. මේ අනුව මෙම MV ඇවන්ට් ගාර්ඩ් නෞකාව රතු මුහුදේ සිට ගමනාරම්භ කර ඇති බව පැහැදිලි වේ. එසේම ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් මෙම නෞකාව ඔවුන්ගේ භාරයට ගන්නා අවස්ථාවේදී සත්‍ය වශයෙන්ම එය තිබුණේ ජාත්‍යන්තර මුහුදේය යන්න සම්බන්ධයෙන්ද හබයක් නැත. අනෙක් අතට මෙම නෞකාව ශ්‍රී ලංකා ධජය සහිත නෞකාවක් වන හෙයින්, යම්කිසි අපරාධයක් සම්බන්ධයෙන් අධිකරණ බලය තීරණය කිරීමේදී එය දේශීය ජල තීරය තුළ තිබුණද, නොතිබුණද මෙම අධිකරණයට, අධිකරණ බලය තිබෙන්නේය යන කරුණ සම්බන්ධයෙන්ද විවාදයක් නැත.

2015.10.06 වන දින නාවික හමුදාව විසින් ඉහත නෞකාව තම භාරයට ගත් අවස්ථාවේදී ඒ තුළ වූ පුපුරණ ද්‍රව්‍ය ප්‍රවාහනය සම්බන්ධයෙන් බලපත්‍රයක් තිබුණේද යන කරුණ සලකා බැලීමේදී වැදගත්ම සාක්ෂිකරු වන්නේ මෙම කාල සීමාවට අදාළව ශ්‍රී ලංකා ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වූ කරුණාසේන හෙට්ටිආරච්චි මහතාය. විශේෂයෙන්ම 2005 අංක 18 සහ 1969 අංක 33 දරන පනත්වලින් සංශෝධිත 1956 අංක 21 දරන පුපුරණ ද්‍රව්‍ය පනතේ 2(1) වගන්තිය යටතේ බලපත්‍ර නිකුත් කිරීමේ බලධාරියා වන්නේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වේ.

පැමිණිල්ලේ සාක්ෂි අංක 35ට අනුව 11 වන චූදිත විසින් තමාගෙන් උපදෙස් පතමින් **පැ.7** ලේඛනය ඉදිරිපත් කළ බව පවසන ලදී. **පැ.7** ලේඛනය මගින් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා, එනම් 11 වන චූදිත රක්නා ආරක්ෂක ආයතනයට අයත් ගිනිඅවි සම්බන්ධයෙන් කරුණු දක්වා ඇති අතර ඇවන්ට් ගාර්ඩ් නෞකාව රතු මුහුදේ සිට ගාලු වරාය දක්වා පැමිණීම සම්බන්ධයෙන් කරුණු දක්වා ඇත. මෙම සාක්ෂිකරු සාක්ෂි දෙමින් පවසා ඇත්තේ **පැ.7** ලේඛනයේ සඳහන් කරුණු තමා අනුමත කරමින් හා නිසි ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් ඉදිරි පියවර ගන්නා ලෙසට උපදෙස් ලබාදුන් බවයි. සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් පවසා සිටියේ අදාළ ගිනිඅවි සහ පුපුරණ ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීම සඳහා බලපත්‍රයක් ඉල්ලා සිටිමින් 2015.09.24 දිනැති අයදුම් පත්‍රයක් ඉදිරිපත් කර තිබූ හෙයින් ඒ සම්බන්ධයෙන් **පැ.6(5 වි.18)** දරන බලපත්‍රය නිකුත් කර ඇති බවත්ය.

**පැ.6** බලපත්‍රය සම්බන්ධයෙන් විස්තරාත්මකව කරුණු පැහැදිලි කළ සාක්ෂිකරු පවසා ඇත්තේ ඉහත කී 2015.09.24 දිනැති අයදුම් පත්‍රය 2015.09.28 දින ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් වී තිබුණද එම බලපත්‍රය සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේදී කිසියම් ප්‍රමාද දෝෂයක් ආරක්ෂක අමාත්‍යාංශය වෙතින් සිදු වී ඇති බවයි. එම ප්‍රමාද දෝෂය නිවැරදි කිරීමේ වගකීම ආරක්ෂක අමාත්‍යාංශය සතු බවද පවසන ලදී. මෙම සාක්ෂිකරුගේ සාක්ෂිය සැළකිල්ලෙන් විශ්ලේෂණය කිරීමේදී පැහැදිලිව පෙනී යන්නේ **පැ.6** දරන බලපත්‍රය මෙම නඩුවේ ප්‍රශ්නගත ගිනිඅවි සහ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් වලංගු බලපත්‍රයක්

ලෙස සැලකීමට සිදු වන බවයි. අනෙක් අතට **පැ.6** බලපත්‍රයේ නීත්‍යානුකූල භාවය සම්බන්ධයෙන් කිසිදු සැක සහිත තත්ත්වයක් හෝ අවිනිශ්චිත භාවයක් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් කිසිසේත්ම අනාවරණය නොවේ. ඇත්තෙන්ම **පැ.6** බලපත්‍රය සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ හරය වන්නේ එම බලපත්‍රය නීත්‍යානුකූල ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස නිකුත් කළ බලපත්‍රයක් බවයි. මෙම සාක්ෂිකරුගේ සාක්ෂියේ හරය සැලකිල්ලට ගැනීමේදී පැහැදිලිව පෙනී යන්නේ **පැ.6** බලපත්‍රය වලංගු අවසර පත්‍රයක් ලෙස සැලකිය යුතු බවත්, එය රාජකාරීමය වශයෙන් ලබාදුන් නිවැරදි ලිපියක් බවත්, එමගින් අදාළ නෞකාවේ තිබූ ගිනිඅවි සහ පුපුරණ ද්‍රව්‍ය සන්තකයේ තබා ගැනීමේ අවසරය හිමි වන බවත්ය. ඒ සම්බන්ධයෙන් මෙම සාක්ෂිකරු ලබාදුන් සාක්ෂියෙන් පහත සඳහන් කොටස පහසුව තකා උපුටා දක්වමු.

<u>අධිකරණයෙන්.</u>

ප්‍ර : පැ.06 (5 වි.18) ලිපිය මහත්මයා සළකන්නේ කුමක් ලෙසද?

උ : **මෙම ලිපිය රාජකාරීමය වශයෙන් දුන්න නිවැරදි ලිපියක් ස්වාමීණි. එය වලංගුතාවයක් දුන් ලිපියක් හැටියට ස්වාමීණි.**

ප්‍ර : **ඔය පැ.06 කියන ලිපිය මහත්මයා අවසර පත්‍රයක් ලෙස සලකනවාද?**

උ : **ඒ නිලධාරියාට බලය දීලා තිබෙනවා මේ ආකාරයට සටහනක කෙටි අත්සනක් යොදා දුන්න උපදෙසක් අනුව කටයුතු කිරීමට බලය දුන්නට පස්සේ, එතකොට මගේ උපදෙසක් අරගෙන එම ලිපිය නිකුත් කිරීමේ බලය එම නිලධාරියාට තිබෙනවා ස්වාමීණි.**

ප්‍ර : පැ.06 ලිපිය අනුව දීලා තිබෙන බලය කුමක්ද?

උ : **ගොඩබෑමට අවසර දීලා තිබෙනවා ස්වාමීණි, නාවික හමුදාවේ සහ රේගුවේ අධීක්ෂණයයටතේ ස්වාමීණි. 2 වන ඡේදයෙන් අවසරය දීලා තිබෙනවා ස්වාමීණි, එහි සඳහන් කරලා තිබෙන අවි ආයුධ සහ**

**උණ්ඩ සමග (පැ.06 ලේඛනයේ 2 වන ඡේදය ඉංග්‍රීසි භාෂාවෙන් කියවා සිටි)**

**ප්‍ර : සිංහල භාෂාවෙන් දළ වශයෙන් කියන්න?**

**උ : මෙම නෞකාවේ තිබුණු ආයුධ සහ උණ්ඩ සහ අදාල උපකරණ රතු මුහුදේ සිට ගාලු වරායට ඇවන්ට් ගාර්ඩ් නෞකාවෙන් ගෙනැවිත් රක්නා ලංකා සමාගමේ අවි ගබඩාවට මාරු කිරීමට මෙයින් අවසර දෙමි.**

ඉහත කරුණු අනුව පැහැදිලිව පෙනී යන්නේ **පැ.6** අවසර පත්‍රය අදාළ ගිනිඅවි සහ පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධයෙන් වලංගු අවසර පත්‍රයක් ලෙස සැලකිය යුතු බවයි.

පැමිණිල්ල වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරයා විශේෂයෙන් සඳහන් කලේ **පැ.6** දරන අවසර පත්‍රය ආරක්ෂක ලේකම්වරයා සඳහන් කරන ආකාරයෙන් බලපත්‍රයක් ලෙස සැලකුවද අදාල නැව රතු මුහුදේ සිට පිටවන අවස්ථාව වන විට **පැ.9** දරන අදාල ඉල්ලුම් පත්‍රය ඉදිරිපත්ව නොතිබුණු බවත්, ඒ අනුව පැ.6 අවසර පත්‍රය ලබාදී ඇත්තේ අදාල සිද්ධියෙන් අනතුරුව අදාල අවි ශ්‍රී ලංකාවේ මුහුදු තීරයට ගෙන ඒමෙන් අනතුරුව වන බැවින් **පැ.6** අවසර පත්‍රය අතීතයට බලපාන ලෙස නිකුත් කිරීමට හැකියාවක් නොමැති බවයි. එසේ හෙයින් එකී අවසර පත්‍රය වලංගු අවසර පත්‍රයක් ලෙස සැලකිය නොහැකි බවට කරුණු දක්වන ලදී. ඒ අනුව උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරයාගේ තර්කය වූයේ වලංගු අවසර පත්‍රයක් ලෙස පැ.6 සැලකුවද අතීතයට බලපාන අයුරින් බලපත්‍රයක් නිකුත් කළ නොහැකි බැවින් වූදිතයින් අදාල වරදට වැරදිකරුවන් වන බවයි. එහිදී ඔහු භාවිතා කල වචන වූයේ **''Technically guilty of an offence''** යන්නයි.

නමුත් විත්තිය එයට එරෙහිව තර්ක කර සිටියේ අදාල පැ.6 අවසර පත්‍රය පසුව නිකුත් කර ඇත්තේ වුවද ආරක්ෂක ලේකම්වරයා අදාල බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් වූ නිසි බලධාරියා සහ පූර්ණ බලධාරියා වන බැවින් පසුව එයට අවසර දීමේ *nunc pro tunc* (now for then) සිද්ධාන්තය යටතේ වලංගු

වන බවයි. මේ සම්බන්ධයෙන් ආරක්ෂක ලේකම්වරයාගේ සාක්ෂියෙන් තහවුරු වනුයේ ඔහු මෙම සම්පූර්ණ ක්‍රියාවලිය, එනම් රතු මුහුදේ සිට ශ්‍රී ලංකාව තෙක් පැමිණීමත්, එතැන් සිට ගාලු වරයාට ගොඩබෑම සම්බන්ධයෙන් වූ ක්‍රියාවලියට **පැ.6** අවසර පත්‍රය මගින් අවසර දී ඇති බවයි. මේ සම්බන්ධයෙන් ඇමරිකානු මැසචුසෙට්ස් ශ්‍රේෂ්ඨාධිකරණය **Almeida Bus Lines, Inc.Vs.Department of Public Utilities & another** නඩුවේදී තීරණය කර ඇත්තේ බස් මගින් ප්‍රවාහනය සම්බන්ධයෙන් අවසර දීලා ඉදිරිපත් කර ඇති ඉල්ලුම් පත්‍රයක් එසේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කර වසර කිහිපයකින් පසුව අනුමත කිරීම වුවද අදාල ඉල්ලුම්පත්‍රයේ දින සිට එය අනුමත කිරීමක් ලෙස සැලකිය හැකි බවයි. එයට පදනම ලෙස සලකා ඇත්තේ ඉහත කී *nunc pro tunc* සිද්ධාන්තය වේ. ඒ අනුව සලකා බැලීමේදී පැ.6 දරන අවසර පත්‍රය ආරක්ෂක ලේකම්වරයා විසින් අදාල අවි ශ්‍රී ලංකාවට පැමිණීමෙන් අනතුරුව නිකුත් කලේ වුවද එකී සම්පූර්ණ ක්‍රියාවලියම අනුමත කිරීම ඉන් සිදුව ඇති බවයි. එනම් එකී අවසර පත්‍රය රතු මුහුදේ සිට ගාලු වරායට පැමිණ අදාල ගිනිඅවි සහ උණ්ඩ ගොඩබෑම සඳහා වූ සම්පූර්ණ ක්‍රියාවලිය සඳහා අවසර පත්‍රයක් ලෙස සැළකිය යුතු බවයි. ඉහත කී නඩු තීන්දුවෙන් පෙර කී *nunc pro tunc* සිද්ධාන්තය විධායක හෝ පරිපාලන ක්‍රියාවක් සම්බන්ධයෙන්ද වලංගු වන බව හොඳින් තහවුරු වේ.

මීළඟට විත්තිය විසින් ඉදිරිපත් කරන ලද අනෙක් තර්කය එනම් 7549 හා 7560 දරන අධිචෝදනා දෙක ඉදිරිපත් කර ඇත්තේ පුපුරණ ද්‍රව්‍ය පනතේ 9(2) වගන්තිය යටතේ වන හෙයින් ඊට අදාල මූලික අංග ඔප්පු කිරීමට පැමිණිල්ල අසමත් වී ඇති බවයි.

පනතේ 9(2) වගන්තිය අනුව නිසි බලධාරයාගෙන් ලබාගන්නා ලද අවසර පත්‍රයක් නොමැතිව කිසිදු පුද්ගලයෙකුට පුපුරණ ද්‍රව්‍ය ආනයනය කිරීම, අපනයනය කිරීම, අත්පත් කර ගැනීම, සන්තකයේ තබා ගැනීම, ප්‍රවාහනය කිරීම හා භාවිතා කිරීම නොකළ යුතු බවට සඳහන් කර ඇත.

පනතේ 10 වන වගන්තිය අනුව පුපුරණ ද්‍රව්‍ය පාලකවරයා විසින් නිශ්වය කරන ප්‍රමාණය නොඉක්ම වන්නා වූ අවස්ථාවකදී එසේ පුපුරණ ද්‍රව්‍ය අත්පත්

කර ගැනීමට, සන්තකයේ තබා ගැනීමට, ප්‍රවාහනයට හෝ භාවිතා කිරීම සඳහා අවසර පත්‍රයක් අවශ්‍ය නොවන බවට විස්තර කර ඇත.

ඉහත සඳහන් 9(2) වගන්තියත්, 10 වගන්තියත් එක්ව ගත් කළ පැහැදිලි වන්නේ පුපුරණ ද්‍රව්‍ය පනත යටතේ පාලකවරයා විසින් නිශ්චය කරන ලද ප්‍රමාණයකට වඩා වැඩි ප්‍රමාණයක් ළඟ තබා ගැනීම, ප්‍රවාහනය කිරීම වැනි අවස්ථාවකදී පමණක් යම්කිසි පුද්ගලයෙකු වරදකරු වන බවයි.

ඒ අනුව පැමිණිල්ල විසින් පනතේ 9(2) වගන්තිය යටතේ යම් පුද්ගලයෙකුට එරෙහිව අධිචෝදනා නගන අවස්ථාවකදී අනිවාර්යයෙන්ම ප්‍රශ්නගත පුපුරණ ද්‍රව්‍ය සඳහා පුපුරණ ද්‍රව්‍ය පාලකවරයා විසින් නිශ්චය කරන ලද ප්‍රමාණයකට වඩා වැඩි ප්‍රමාණයක් ප්‍රවාහනය කළ බව ඔප්පු කිරීමේ වගකීම පැමිණිල්ල සතුවේ. නමුත් මෙම නඩුවේදී පැමිණිල්ල ඒ බව ඔප්පු කර නොමැති බව අපි තීරණය කරමු.

මෙම සමස්ථ ක්‍රියාවලිය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් විමර්ශනය කර ඇති අතර එහි ප්‍රධාන විමර්ශන නිලධාරියා වූයේ මෙම නඩුවේ සාක්ෂි අංක 89 ප්‍රධාන පොලිස් පරීක්ෂක අලුත්ගේ සෙනරත් නමැති අයයි. ඔහු විත්තියේ හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් MV ඇවන්ට් ගාර්ඩ් නමැති නෞකාව ශ්‍රී ලංකාවේ නීතියට අනුව ලියාපදිංචි වී ඇති ශ්‍රී ලංකා ෂිපිං සමාගම සතු නෞකාවක් බවට තහවුරු කරගෙන ඇත. 10 වන චූදිත MV ඇවන්ට් ගාර්ඩ් නෞකාවේ සේවයෙහි යොදවා ඇත්තේ ශ්‍රී ලංකා ෂිපිං සමාගම විසින් බව පවසන ලදී.

10 වන චූදිත, විත්තිකූඩුවේ සිට කළ ප්‍රකාශය අනුවද ඉහත ස්ථාවරයම ඔහු දරා ඇත.

මේ අනුව අප විසින් ඉහතින් පෙන්වා දුන් පරිදි, පුපුරණ ද්‍රව්‍ය පනතේ 30(1) වගන්තිය අනුව අවසර පත්‍රයක් අවශ්‍ය නොවන්නේය යන ස්ථාවරය අනුවද, අවසර පත්‍රයක් අවශ්‍ය බවට උපකල්පනය කරමින් පැ.6 දරන ලේඛනයේ වලංගු භාවය සලකා බැලුවද, එසේම පනතේ 9(2) උපවගන්තිය යටතේ ඔප්පු කළ යුතු සාධක ඔප්පු නොකිරීම යන කරුණ සලකා බැලුවද 10

වන චූදිතට එරෙහිව අපරාධමය වගකීමක් පැවරීමට කරුණු ඉදිරිපත් වී නොමැති බවට අපි තීරණය කරමු. එබැවින් ඉදිරිපත් කර ඇති 7549 සහ 7561 අධිචෝදනා ඔප්පු කර නොමැති බව අපි තීරණය කරමු. මේ අනුව ඉහත අධිචෝදනාවලට සම්බන්ධ කරමින් ඉදිරිපත් කර ඇති ආධාර හා අනුබල දීමේ චෝදනාවන් වන 7552 සිට 7558 දක්වා අධිචෝදනා සහ 7563 සිට 7569 දක්වා අධිචෝදනා ද ඔප්පු කර නොමැති බවට අපි තීරණය කරමු.

මීළඟට සලකා බැලිය යුතු වන්නේ 7571 අධිචෝදනාව වේ. එම අධිචෝදනාවේ හරය වන්නේ රතු මුහුදේ සිට ගාලු වරාය දක්වා ගිනිඅවි 813 ක් සහ ජීව උණ්ඩ 200, 935 ක් ප්‍රවාහනය කිරීම සඳහා අවසර ඉල්ලමින් සීමා සහිත රක්නා ආරක්ෂණ ලංකා පුද්ගලික සමාගම සහ ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සර්විසස් පුද්ගලික සමාගම 2015.09.28 වන දින ඉල්ලුම් පත්‍රයක් ආරක්ෂක අමාත්‍යාංශයට යොමු කළ බවට බොරු සාක්ෂි ගෙතීමයි. මෙම අධිචෝදනාවට අදාළ ලේඛනය වන්නේ **පැ.9(a)** ලෙස සලකුණු කරන ලද ඉල්ලුම් පත්‍රයයි. එම ලේඛනය අප සැළකිල්ලෙන් සලකා බලන ලදී. එහි රක්නා ආරක්ෂක සමාගම වෙනුවෙන් අත්සන් කර ඇත්තේ දැනට මියගොස් සිටින 5 වන චූදිතය. ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සර්විසස් සමාගම වෙනුවෙන් අත්සන් කර ඇත්තේ 7 වන චූදිතය. ඊට අමතරව ආරක්ෂක අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ලෙස 11 වන චූදිත අත්සන් කර ඇත. ඉහත කී අත්සන් සහ අදාළ සටහන් නිර්ව්‍යාජ බවට කිසිදු විවාදයක් නැත. තවද **පැ.9(a)** ලේඛනය 5 චූදිත සහ 7 චූදිත අත්සන් කර ඇත්තේ 2015.09.24 දින හෝ ඉන් පසුව බව පැහැදිලිය. තවද එම ලේඛනය 11 වන චූදිත විසින් අත්සන් කර ඇත්තේ 2015.10.06 දිනය. ඒ අනුව මෙම ලේඛනය ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත්තේ 2015.09.24 දින සහ 2015.10.06 දින අතර කාලයේ කිසියම් දිනක විය යුතුය. එම ලේඛනය 2015.09.28 දින නොවන වෙනත් දිනක ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් වූ බවටද කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නැත. මෙම පසුබිම තුළ කරුණු විශ්ලේෂණය කිරීමේදී පෙනී යන්නේ **පැ.9(a)** ලේඛනය මගින් බොරු සාක්ෂි ගෙතීමක් සිදු කළ බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති බවයි.

ඇත්තෙන්ම එම ලේඛනය ව්‍යාජ ලේඛනයක් බවටද කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නැත.

පැමිණිල්ල වෙනුවෙන් කැඳවන ලද පැ.සා. 30 සාක්ෂිකාරිය පවසා සිටින ලද්දේ **පැ.8** ලේඛනයෙහි ඇවන්ට් ගාර්ඩ් සමාගමේ සභාපතිවරයාගෙන් හෝ රක්නා ලංකා සමාගමේ සභාපතිවරයාගෙන් හෝ කිසිදු ලිපියක් 2015.09.28 දින වනවිට ලැබී නොතිබුණු බවයි. ඒ බව අදාල ආයතනයේ **Receiving Internal and External Letters and Documents** ලේඛනයෙන් තහවුරු වන බව පවසා ඇත. එසේම පැ.සා. 31 ප්‍රියංගනීගේ සාක්ෂියෙන් පැහැදිලි වනුයේ ආරක්ෂක අමාත්‍යාංශයේ අදාල අවසර පත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේදී සිදුවනුයේ පෙන්ඩ්‍රයිව් එකකට දාගෙන එනු ලබන අවසර පත්‍ර හා ඉල්ලුම් පත්‍ර අමාත්‍යාංශයේ ලිපි ශීර්ෂයකට ඇතුලත් කිරීමෙන් අනතුරුව නිකුත් කිරීම සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රියාමාර්ගය වන බවයි. ඒ අනුව තහවුරු වනුයේ අදාල ඉල්ලුම් පත්‍ර හා අවසර පත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයක් හෝ ක්‍රියා පටිපාටියක් අමාත්‍යාංශය තුළ නොතිබුණු බවයි. ඒ අනුව පෙර කී පැ.8 පොතෙහි අදාල ඉල්ලුම් පත්‍රය ඇතුලත් නොවූ පමණින් එවැනි නිසි ක්‍රියාමාර්ගයක් අමාත්‍යාංශය තුළ ඉල්ලුම් පත්‍ර හා අවසර පත්‍ර නිකුත් කිරීමේදී අනුගමනය නොකර තිබියදී **පැ.9(a)** ලේඛනය ව්‍යාජ ලේඛනයක් ලෙස සැළකිය හැකිද යන්නයි. මේ සම්බන්ධයෙන් පැහැදිලි සාක්ෂියක් දිය හැකි හොඳම සාක්ෂිකරු වනුයේ පැ.සා. 35 වූ පුපුරණ ද්‍රව්‍ය පිළිබඳ නිසි බලධාරියා වන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාය. නමුත් **පැ.9(a)** ලේඛනය ව්‍යාජ ලේඛනයක් බව තහවුරු කිරීමට අදාල වන කිසිදු ප්‍රශ්නයක් එම සාක්ෂිකරුගෙන් පැමිණිල්ලෙන් විමසා නොමැත. නමුත් එම සාක්ෂිකරුගේ සාක්ෂියෙන් තහවුරු වනුයේ **පැ.9(a)** අවසර පත්‍රය නිසි ලෙස ඉදිරිපත් කර තිබූ බවත්, අමාත්‍යාංශයේ ප්‍රමාද දෝෂයකින් එය අනුමත කර **පැ.6** අවසර පත්‍රය ලබා දීම ප්‍රමාද වී ඇති බවත්, ඒ අනුව නිසි බලධාරියා වශයෙන් ඔහු එය පසුව අනුමත කරන ලද බවත්ය.

එසේම පැ.සා. 89 වන ප්‍රධාන විමර්ශන නිලධාරී වන පොලිස් පරීක්ෂක අලුත්ගේ සාක්ෂියෙන් තහවුරු වනුයේ මෙම නඩුවට අදාලව විමර්ශනයේදී

ආරක්ෂක අමාත්‍යාංශයෙන් පවත්වාගෙන ගිය MODUD/CS/FA/AT/2013 යන ගොනුව තුළ **පැ.9** දරන ආවරණ ලිපියද, **පැ.9(a)** දරන ඉල්ලුම් පත්‍රයද තිබී ඇති බවත්, ඒවායේ මුල් ලේඛන නොතිබුණු බවත්ය.

එම සියලු කරුණු සළකා බැලීමේදී **පැ.9(a)** ලේඛනය ව්‍යාජ ලේඛනයක් ලෙස තීරණය කිරීමට හැකියාවක් නොමැති බව අපි තීරණය කරමු.

අනෙක් අතට මෙම ප්‍රශ්නගත ඉල්ලුම් පත්‍රය 2015.09.28 වන දින ආරක්ෂක අමාත්‍යාංශය වෙත නිසි පරිදි ඉදිරිපත් වූ බව එවකට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා වූ කරුණාසේන හෙට්ටිආරච්චි නමැති සාක්ෂිකරුගේ සාක්ෂියෙන්ද පැහැදිලිව අනාවරණය වී ඇත.

ඉහත කරුණු අනුව පැහැදිලිව පෙනී යන්නේ 7571 අධිචෝදනාව ඔප්පු කිරීමට පැමිණිල්ල අපොහොසත් වී ඇති බවයි. එහි ප්‍රතිඵලයක් ලෙස ඉහත කී වරදට අනුබල දීමේ පදනම මත චෝදනා නගා ඇති 7572 සහ 7573 දරන අධිචෝදනාද පවත්වාගෙන යාමේ නීතිමය හැකියාවක් නොමැති බවට අපි තීරණය කරමු.

ජාත්‍යන්තර මුහුදේ වෙළඳ නැව්වලට ආරක්ෂාව සැපයීම සඳහා පාවෙන අවි ගබඩා පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් වන නීති තත්ත්වය අප රට තුළ පමණක් නොව ජාත්‍යන්තර වශයෙන්ද සලකා බලන විට වියවුල් සහගත තත්ත්වයක් ඇති බව එනම්, එම නීතිය නිශ්චිතතාවයකින් තොර බව පෙනී යයි.

ඇමරිකාවේ කීර්තිමත් විශ්ව විද්‍යාලයක් වන **Georgetown University** හි 2017 වසරේ ප්‍රකාශයට පත් කරන ලද **Georgetown Journal Of The International Law** නමැති ජර්නලයෙහි **Alexis Wilpon** නමැති රචිකාව ප්‍රකාශයට පත් කර ඇති **Floating Armories: A Legal Grey Area In Arms Trade And The Law Of The Sea** නමැති ලිපියෙහි මෙම තත්ත්වය මැනවින් සාකච්ඡා කර ඇත. එකී ලිපියෙහි සංක්ෂිප්තය පරිශීලනය සඳහා පහත සටහන් කරමු.

*"In response to maritime piracy concerns, shippers often hire armed guards to protect their ships. However, due to national and international laws regarding arms trade, ships are often unable to dock in foreign ports with weapons and ammunition. As a response, floating armories operate as weapons and ammunition storage facilities in international waters. By operating solely in international waters, floating armories avoid national and international laws regarding arms trade. However, there is a significant lack of regulations governing floating armories, and this leads to serious safety concerns including lack of standardized weapon storage, lack of records documenting the transfer of weapons and ammunitions, and lack of regulation from flags of convenience. Further, there is no publically available registry of floating armories and so the number of floating armories operating alongside the quantity of arms and ammunition on boards is unknown. This Note suggests several solutions that will increase the transparency and safety of floating armories. Such solutions include requirements that floating armory operators register their vessels only to states in which a legitimate relationship exists, minimum standards that operators must follow, and the creation of a publically available registry. Finally, it concludes by providing alternative mechanisms by*

***which states may exercise jurisdiction over foreign vessels operating in the High Seas."***

මේ අනුව අප ඉහතින් සඳහන් කළ පරිදි ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් මත හා රජයට අයත් සමාගමක් වන රක්නා ආරක්ෂක ලංකා සමාගම සහ ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සර්විසස් සමාගම අතර වූ නීත්‍යානුකූල ගිවිසුමක් මත ඉහත කාර්ය සිදුවී ඇති අවස්ථාවක සහ අන්තර් ජාතික වශයෙන්ද මීට අදාල නීති තත්ත්වයන් තුළ හිඩැසක් පවතින විට යමෙකුට එරෙහිව අපරාධ චෝදනා ගොනු කිරීමේදී ඉතා සුපරික්ෂාකාරීව කටයුතු කළ යුතු බව අපගේ හැඟීමයි. නීතිපතිවරයා විසින් චූදිතයන්ට අධිචෝදනා ගොනු කලේ පුද්ගල මණ්ඩලවල අපරාධ වගකීම (Corporate criminal liability) යන පදනම මත උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරයා සඳහන් කලද මූලික විරෝධතා සම්බන්ධයෙන් මෙම ත්‍රිපුද්ගල විනිශ්චය සභාව විසින් 2020.01.17 දින එම තර්කය ප්‍රතික්ෂේප කරන ලදී. එකී නියෝගය අභියෝගයට ලක් නොවූ තත්ත්වයක් තුළ 13 චූදිත වන වික්ටර් සමරවීරට එරෙහිව නඩුව ඉදිරියට පවත්වාගෙන ගියේ කෙසේද යන්න ගැටළුවකි. මක්නිසාදයත් 7558 සහ 7569 යන චෝදනා මගින් ඔහුට පුද්ගලික වගකීමක් පවරා තිබුණද විමර්ශන නිලධාරියාගේ සාක්ෂියට අනුවම 13 වන චූදිත අත්අඩංගුවට ගෙන ඇත්තේ ඔහු හුදෙක් රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපතිවරයා වීම නිසාම පමණි. වසර 34 ක් රාජ්‍ය සේවයේ යෙදී පරිපාලන නිලධාරියෙකු වශයෙන් විශ්‍රාම ගිය පුද්ගලයෙකු මේ ආකාරයට අත්අඩංගුවට ගෙන රක්ෂිත බන්ධනාගාරගත කර තිබීම කිසිසේත් අනුමත කළ නොහැකිය. ඔහු චෝදනාවන්වලට ලක් වන්නේද, බන්ධනාගාරගත වන්නේද අන් කිසිවක් නිසා නොව රජයට අයත් රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සභාපති වීම නිසාම පමණි.

එසේම 6,8 සහ 9 යන චූදිතයින්ද අත්අඩංගුවට පත් වන්නේද චෝදනා ගොනු වන්නේද ඉහත කී සමාගම්වල ක්‍රියාවන්වල යෙදීම හේතුවෙනි. ශ්‍රී ලංකා රජයේ අනුමැතිය මත නීත්‍යානුකූලව පවත්වාගෙන ගිය ආයතනයක ක්‍රියාවක් කිරීම නිසාම ඔවුන් අත්අඩංගුවට පත් වී ඇත. කිසිදු අවස්ථාවක පාවෙන අවි

ගබඩා පවත්වාගෙන යාම නීතිවිරෝධී ක්‍රියාවක් බවට සාක්ෂි ඉදිරිපත් වී නැත. දීර්ඝ කාලයක් ඔවුන් ත්‍රිවිධ හමුදාවේ රාජකාරී කර විශ්‍රාම ලබා හෝ ක්‍රියාන්විත සේවයේ යෙදී ආබාධයට ලක්වීමෙන් පසු නීත්‍යානුකූල රැකියාවක යෙදෙන අවස්ථාවක දී හුදෙක් ඔවුන් එකී රැකියාවේ යෙදීම මතම අත්අඩංගුවට පත්ව සිරගත වීම ඔවුන්ට වූ බලවත් අයුක්තියක් බව සටහන් කරමු.

11 වන චූදිත සම්බන්ධයෙන් ගත් කලද ඔහු රටේ සිවිල් නිලධරයෙකු වශයෙන් රාජකාරී කිරීමේදී යම් අඩුපාඩුවක් සිදු වී යැයි උපකල්පනය කලද එවැන්නෙකුට අපරාධ වගකීමක් පැවරිය හැකිද යන්න බරපතල ගැටළුවකි. විශේෂයෙන්ම පැ.7 දරන ලේඛනය මත පදනම්ව පුපුරණ ද්‍රව්‍ය පාලකවරයා වන ආරක්ෂක ලේකම්වරයා **පැ.6** දරන ලේඛනය ඔහු විසින් අත්සන් තබන ලද නෛතිකමය වශයෙන් බලධාරී ලේඛනයක් වශයෙන් පවසා තිබියදී සහ 11 වන චූදිත කරන ලද නීති විරෝධී ක්‍රියාවක් සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ඉදිරිපත් වී නොමැති අවස්ථාවක ඔහුට විරුද්ධවද අපරාධ චෝදනාවක් ගොනු කලේ කෙසේද යන්න ගැටළු සහගතය.

10 වන චූදිත අත්අඩංගුවට පත්වන විට ඔහු MV ඇවන්ට් ගාර්ඩ් නෞකාවේ කපිතාන්වරයා වේ. පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි දුන් ලුතිනන් කමාන්ඩර් වීරසිංහ 2015.10.05 දින ඉහත නැවට ගොඩවී එකී නැව තම භාරයට ගන්නා අවස්ථාව වන විට අවි සහ උණ්ඩ බහා තිබූ කන්ටේනරය තිබී ඇත්තේ 6 වන චූදිතගේ භාරයේය. එසේම පැමිණිල්ලේ සාක්ෂි අංක 35 එනම්, එවකට රාජ්‍ය ආරක්ෂක ලේකම්වරයාගේ සාක්ෂිය අනුවද මෙම ක්‍රියාන්විතය සඳහා ගිනිඅවි භාවිතා කිරීම, ළඟ තබාගැනීම යන සියල්ලෙහිම වගකීම තිබී ඇත්තේ රක්නා ආරක්ෂක ලංකා සමාගම සතුව වේ. එය සම්පූර්ණයෙන්ම ආරක්ෂක අමාත්‍යාංශය යටතේ වූ රාජ්‍ය සමාගමකි. අනෙක් අතට 10 වන චූදිත යුක්‍රේනියානු ජාතිකයෙකු වශයෙන් නීත්‍යානුකූල ගිවිසුමක් මත සිලෝන් ෂිපිං ලයින්ස් ආයතනයට බැඳී ප්‍රශ්නගත නැවේ කපිතාන්වරයා වීම මතම ඔහු රක්ෂිත බන්ධනාගාරගතව සිටීමත්, තම රටට ගමන් කිරීමට නොහැකි වීමත්, හෘද සැත්කමක් සඳහා තම පවුලේ අයගේ රැකවරණය ලබා ගැනීමට නොහැකි වීමත්

සළකා බලනවිට අප රටේ අපරාධ යුක්ති ක්‍රියාදාමය පිළිබඳව නැවත සිතා බැලිය යුතු බව සටහන් කර තබමු.

විශේෂයෙන්ම මෙම නඩුවේ ඉදිරිපත් වූ සාක්ෂි සලකා බැලීමේදී විමර්ශන අවස්ථාවේදී මෙම නඩුවේ චූදිතයන් අත්අඩංගුවට ගැනීම සඳහා බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂි තිබුණේද යන්න බරපතල ගැටළුවකි. යම්කිසි අපරාධයක් සම්බන්ධයෙන් තොරතුරක් විමර්ශකයෙක් වෙත ලද අවස්ථාවේදී එම තොරතුරු පිළිගත හැකි කරුණු මත පදනම්ව තිබේනම් පමණක් චූදිතයෙකු අත්අඩංගුවට ගෙන මහේස්ත්‍රාත්වරයෙකු වෙත ඉදිරිපත් කිරීම සඳහා පියවර ගත යුතු බව අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 116 වන වගන්තියේ සඳහන් කර ඇත. මේ සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය **Tunnaya aliyas Gunapala vs Officer In Charge, Police Station, Galewela 1993 1 SLLR 61** හි වාර්තා වී ඇති නඩුවෙහි අවධාරණය කර ඇත. ඒ අනුව යම්කිසි පුද්ගලයෙකු යම්කිසි අපරාධයක් හෝ වරදක් සඳහා සැක මත අත්අඩංගුවට ගැනීමේදී එකී සැකය තහවුරු කරගැනීම සඳහා යම් නිශ්චිත සාක්ෂි තිබිය යුතු අතර හුදෙක් අවිනිශ්චිත, අනුමාන කරුණු මත එසේ නොකළ යුතු බව **R vs Behary 7 W.R.3 නඩුව සහ Appu vs Hamy (1900) 1 Br.34.** නඩු උපුටා දක්වමින් අප රටේ කීර්තිමත් විනිසුරුවරයෙකු වූ **Reginald F. Dias** මහතා විසින් රචිත **A COMMENTARY ON THE CEYLON CRIMINAL PROCEDURE CODE** නැමැති ග්‍රන්ථයෙහි පළවන වෙළුමේ 72 වන පිටුවේ සඳහන් පහත ඡේදය සටහන් කිරීම වැදගත් බව අපි තීරණය කරමු.

**"What is a reasonable complaint or suspicion must depend on the circumstances of each particular case; but it must be at least founded on some definite fact tending to throw suspicion on the person arrested, and not mere vague, surmise or information. Still less have the Police any power to arrest persons … merely on the chance of something being hereafter proved against them… "**

ඉහත සඳහන් සියළුම කරුණු සලකා බලා ඉදිරිපත් කර ඇති සියළුම චෝදනාවලින් සියළුම චූදිතයින් නිදොස් කර නිදහස් කරමු.

මෙම නඩුවට අදාල සමස්ත විභාගයම ඉතාමත් කෙටි කලක් තුල අවසන් කර ගැනීමට සහාය ලබා දුන් පැමිණිල්ලේ උගත් ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥවරයා ඇතුළු නීතිඥ මඩුල්ලටද, විත්තිය වෙනුවෙන් පෙනී සිටි උගත් ජනාධිපති නීතිඥවරුන් ඇතුළු නීතිඥ මඩුල්ලටද, මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා ඇතුළු අධිකරණ කාර්ය මණ්ඩලයටද මෙම විනිසුරු මඩුල්ලේ ස්තූතිය හිමි වන බව මෙහි සටහන් කර තබමු.

| | | |
|---|---|---|
| **(ආදිත්‍ය පටබැඳිගේ)** | **(මංජුල තිලකරත්න)** | **(එම්.ඩබ්.ජේ.කේ.වීරමන්)** |
| **මහාධිකරණ විනිසුරු (සභාපති)** | **මහාධිකරණ විනිසුරු** | **මහාධිකරණ විනිසුරු** |
| **කොළඹ** | **කොළඹ** | **කොළඹ** |
| 2021.05.21 | 2021.05.21 | 2021.05.21 |